**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය - 2022**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කළ මතය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ "මණ්ඩලය"2022 දෙසැම්බර් 31 දිනටමූල්‍යතත්ත්ව ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරනපාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
මණ්ඩලයේමූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධවපරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේවාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

  අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරනලදගිණුම්කරණප්‍රතිපත්තිවලඋචිතභාවය , ගිණුම්කරනඇස්තමේන්තුවලසාධාරණත්වයසහකළමනාකරණයවිසින්කරනලදසම්බන්ධිතහෙළිදරව්කිරීම්අගයනලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේකාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමටප්‍රමාණවත්“මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණපහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගම්පහ ඩිපෝව මගින් 2022 අගෝස්තු මාසය තුළදී එකතු වටිනාකම රු.83,862,900 ක් වූ ලීටර් 13,200 ක බවුසර් 12 කින් සහ ලීටර් 6,600 බැගින් වූ බවුසර් 06 කින් ඩීසල් මිලදී ගැනීම සිදු කර තිබුණි. මෙම මිලදී ගැනීම්වලට අදාළව නිකුත් කළ ගෙවීම් වවුචර් වලට අදාළ ඉන්වොයිස් හෝ එහි පිටපත් අමුණා නොතිබූ අතර, එම වවුචර් පත්වලට සිදු කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවීය. | 2022 අගෝස්තු මාසය ආසන්න කාලයන්හි නිරන්තරයෙන් ඉන්ධන මිල උච්චාවචනය වීම නිසා වර්ථමානයේ ගෙවන ඉන්ධන තොගයේ මිලත් වර්ථමාන ඉන්ධන මිලත් අතර වෙනස්කම් ඇතිවී ඇති බැවින් මෙම ගෙවීම් සම්බන්ධව අපහැදිලිතාවයන් ඇතිවී ඇත. | ගෙවීම් වවුචර් පිළියෙල කිරීමේදී මුදල් රෙගුලාසි අංක 225 විධිවිධාන වලට අනුකූලව ගෙවීම් වවුචර් පිළියෙල කිරීම හා ගෙවීම් කළ යුතු වේ. |

**1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)සමාලෝචිත වර්ෂයේ නැගෙනහිර කලාපයේ අමතර කොටස් තොගයට අදාලව පමණක් රු.15,639,972 ක යල්පැන හා භාවිතයට ගත නොහැකි තොග පැවතිණි. | භාවිතයට ගත නොහැකි මෙවැනි අමතර කොටස් නැගෙනහිර ප්‍රාදේශිකයේ පමණක් නොව වෙනත් ප්‍රාදේශික වලද ඇති බව හඳුනාගෙන ඇත.එම යල්පැන ගිය තොගඅපහරණය කිරීම සඳහා කටයුතු කරමින් පවතී. | සෑම ඩිපෝවකම ඇති යල්පැනගිය තොග හඳුනාගෙන අගය කර භාවිතයට ගත හැකි තොග ගිණුම් තැබීමට හෝ අනෙකුත් තොග අපහරණයට කටයුතු කළ යුතු වේ. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 16 (LKAS 16) දේපල, පිරියත හා උපකරණ ගිණුම් ප්‍රමිතයේ 37 වන ඡේදයට අනුව මණ්ඩලයේ දේපල, පිරියත හා උපකරණ කාණ්ඩ ගත කළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට රු.75,842,984 ක්වූ හඳුනා නොගත් ස්ථාවර වත්කම්, වෙනත් වත්කම් යටතේ පෙන්වා තිබුණි. | අදාල දෝෂය සිදුවී ඇති බව පිළිගනිමි. | නිවැරදි ගිණුම්කරණ ප්‍රමිතයට අනුව වත්කම් කාණ්ඩ ගත කර ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38 හි 77 වගන්තිය අනුව පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක් ලෙස වෙනම ගිණුම්ගත කල යුතු වුවත්, රු.36,426,972 ක් වටිනා පරිගණක මෘදුකාංග දේපල, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | LKAS 38 අනුව සමහර ස්පෘශ්‍ය වත්කමක් භාවිතා කිරීම සඳහා ඊට අදාල අස්පෘශ්‍ය වත්කම් කොටස සහසම්බන්ධ කිරීම අත්‍යාවශ්‍ය වන අවස්ථා වලදී අදාල අස්පෘශ්‍ය වත්කම LKAS 16 දේපල,පිරියත හා උපකරණ සඳහා අදාල වන ගිණුම් ප්‍රමිතිය අනුව ගිණුම් ගත කිරීමට ඉඩ ලබා දී ඇති බැවින්, පරිගණක මෘදුකාංග LKAS 16 යටතේ ගිණුම්ගත කර ඇත. | නිවැරදි ගිණුම්කරණ ප්‍රමිතියට අනුව පරිගණක මෘදුකාංග ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 16 (LKAS 16) ට අනුව වත්කමක ක්ෂය කළ හැකි අගය ඵලදායී ජීව කාලය තුළ ක්‍රමානුකූලව ක්ෂය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී පරිගණක යන්ත්‍ර, බස් රථ එන්ජින්, ප්‍රවේශ පත්‍ර යන්ත්‍ර හා පරිගණක මෘදුකාංග රු.110,968,183 ක් වැඩියෙන් ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි. | අදාල දෝෂය සිදු වී ඇති බව පිළිගනිමි. | ප්‍රමිතියට අනුව වූ ක්ෂය ගැළපීම් කර නිවැරදි ලාභය ගිණුම්වල පෙන්නුම් කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඉ)ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 07 (LKAS – 07) අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වාර්තා කළ යුතු සේවක කොටස් නිදහස් කිරීමට අදාළව ගෙවා තිබූ රු.77,033,188 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | අදාල දෝෂය සිදුවී ඇති බව පිළිගනිමි. | මුදල් ප්‍රවාහයන් පිළියෙල කිරීමේදී ප්‍රමිතියෙහි දක්වා ඇති අකෘතියට අනුව කටයුතු කළ යුතු වේ. |
| (ඊ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබූ ප්‍රමාණය රු.410,710 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ කාරක ප්‍රාග්ධනයට ගැලපීම් ලෙස රු.9,365,056 ක් දක්වා තිබුණි. ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබූ කෙරීගෙන යන වැඩ කාරක ප්‍රාග්ධන වෙනසට ගැලපීම තුළ කාරක ප්‍රාග්ධන ශේෂය ඉහත අගයෙන් වැඩි වී තිබුණි. එමෙන්ම වර්ෂයේ ප්‍රාග්ධන කාර්යය සඳහා වැය කරන ලද රු.410,710 ක මුදල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | අදාල දෝෂය සිදුවී ඇති බව පිළිගනිමි. | කෙරී ගෙන යන වැඩ වලට අදාළ වාර්ෂික වැය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල නිවැරදිව දැක්විය යුතු වේ. |
| (උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණිත වටිනාකම් පිළිවෙලින් රු.18,894,925,500 ක් හා රු.2,292,972,501 ක් වශයෙන් එකතුව රු.21,187,898,001 ක්වී තිබුණි. නමුත් දේපල පිරියත හා උපකරණ සටහනෙහි ගොඩනැගිලි යටතේ පෙන්වා තිබූ ප්‍රත්‍යාගණන වටිනාකම වූ රු.2,300,199,459 ක අගය සමාලෝචිත වර්ෂයේ එකතු කිරීමක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී ගොඩනැගිලි නව එකතු කිරීම් වටිනාකම වූ රු.7,226,958 ක වටිනාකම දේපල, පිරියත හා උපකරණ සටහනෙහි ගොඩනැගිලි යටතේ දක්වා නොතිබුණි. | සියළුම ගිණුම්ගත කිරීම් කටයුතු Accpack මෘදුකාංගය ඔස්සේ සිදු කරන බැවින් සෑම විටම ලෙජර ගිණුමේ ශේෂය, ශේෂ පිරික්සුමේ ශේෂය සමඟ සමාන වන අතර, එම අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශේෂයට සමාන වේ. | වත්කම් උපලේඛනයේ ප්‍රත්‍යාගණ අගය හා වර්ෂය තුළ එකතු කිරීම් වෙන් වෙන්ව සටහන් කළ යුතු වේ. |
| (ඌ) හැටන් ඩිපෝවේ රු.14,969,516 ක වටිනාකමින් යුත් ටයර් 533 ක බින්කාඩ් පත් යාවත්කාලීන නොකිරීම සහ ටයර් පිළිවෙලකට ගබඩා නොකිරීම නිසා 2022 දෙසැම්බර් 31 දිනට පැවති තොග ශේෂය භෞතිකව පරීක්ෂා කිරීමට නොහැකි විය. | හැටන් ඩිපෝවේ ගබඩා පාලක විසින් බින් කාඩ්පත් යාවත්කාලීන නොකිරීම සහ භාණ්ඩ නිසි ලෙස පිළිවෙලකට ගබඩා නොකිරීම මත මෙම දෝෂය සිදුවී ඇත. | ගබඩා තොග ශේෂ යාවත්කාලීනව හා තොග පිළිවෙලකට ගබඩා කර ගබඩා පවත්වා ගත යුතු වේ. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| ගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වේරහැර මධ්‍යම වැඩපලට අයත්ව තිබූ ශ්‍රී ලංකා යුධ හමුදාවේ කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලීය ශික්ෂණ රෝහල හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිහිටි ඉඩම්වල වටිනාකම රු.මිලියන 6,226 කට තක්සේරු කර තිබූ අතර, එම වටිනාකම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් රු.මිලියන 5,054 ක් ගෙවීමට එකඟ වී තිබුණි. එම මුදලින් රුපියල් මිලියන 4,954 ක් 2021 දෙසැම්බර් 31 වන විට කොටස් වශයෙන් මහා භාණ්ඩාගාරය මගින් ශ්‍රී ලංගම වෙත ගෙවා තිබුණි. ඒ අනුව මෙම වත්කමේ තක්සේරු වටිනාකම වන රු. මිලියන 6,226 හා වත්කම් පැවරීමෙන් සිදු වූ පාඩුව වන රු.මිලියන 1,172 ක වටිනාකම ගිණුම්වල අනාවරණය කර නොතිබුණි. | වේරහැර මධ්‍යම වැඩපළට අයත් සම්පූර්ණ ඉඩමේ තක්සේරු වටිනාකම රු.මි.6,226 කි. මෙයින් රු.මි.5054 ක් ආරක්ෂක අමාත්‍යාංශය විසින් ගෙවිය යුතු අතර, ගෙවන ලද මුදල රු.මි.4954 කි. ඉතිරි මිලියන 100 සහ ඉඩමට ලැබිය යුතු රු.මි.1,272 ක මුදලක් ගිණුම් වාර්තාවන්හි ඇතුළත් කළ යුතු බව පිළිගනිමි. | ඉඩම් වටිනාකම සඳහා ලැබිය යුතු ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීම හෝ හෙලිදරව් කිරීම කළ යුතු වේ. |
| (ආ) 2021 වර්ෂය තුළදී රිය අනතුරු සම්බන්ධයෙන් ගොනු කර තිබූ නඩු 297 කින් 77 ක් සඳහා වන්දි වශයෙන් රු.11,832,191 ක මුදලක් ද, කාර්මික ආරවුල් සම්බන්ධ නඩු 22 ක් සඳහා නිසි පරිදි පෙනී නොසිටීම හේතුවෙන් හා පවරන නඩු වල තාක්ෂණික හා කළමනාකරණ දෝෂ හේතුවෙන් රු.1,830,747 ක මුදලක් වන්දි වශයෙන් ගෙවීමට ද, මණ්ඩලයේ සේවකයන් සේවයෙන් පහ කිරීම සම්බන්ධ අවසන් වූ නඩු වෙනුවෙන් රු.2,439,370 ක් වන්දි වශයෙන් එකතුව රු.16,102,308 ක් ගෙවීමට නියම වී තිබුණි. නමුත් මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ගිණුම්වල සලසා නොතිබුණි. | රිය අනතුරු නඩු 220 ක් විභාග වෙමින් පවතින බව පිළිගන්නා අතර කාර්මික අරවුල් නඩු 10 ක් 2021 වර්ෂයේදී අවසන් කර ඇත. සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් නඩු 47 ක් පමණ විභාග වෙමින් පවතින බව පිළිගන්නා අතර, මේ සඳහා වන්දි ගෙවීමට සිදුවන බැවින්, නඩු කටයුතු කඩිනමින් අවසන් කිරීමට හෝ සමථයට පත් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. | රිය අනතුරු අවම කර ගැනීම සඳහා වැඩ පිළිවෙලක් ක්‍රියාවට නැගිය යුතු අතර වන්දි ප්‍රතිපූරණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ගිණුම්වල සැලසිය යුතු වේ. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| ණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ප්‍රත්‍යාගණන සංචිතය ලෙස ගිණුම් ගත කර තිබූ රු.5,054,000,000 | 2022 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මෙවැනි වැරදි සිදු |

| | | |
|---|---|---|
| ක වටිනාකම සහ බොල් ණය සඳහා වෙන් කිරීම් ලෙස සටහන් කර තිබූ රු.39,713,200 ක වටිනාකමෙහි ශුද්ධ වටිනාකම වූ රු.5,014,286,800 ක වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් අත්හැර තිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට ශුද්ධ මුදල් හා මුදල් සමාන දෑවල ශේෂය රු.2,790,675,691 ක අයිරාවක් බවට පත්ව තිබුණි. ඒ අනුව 2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන ශේෂය ද රු.1,709,451,775 ක අයිරාවක් විය. එබැවින් 2022 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑවල වටිනාකම රු.5,014,286,800 කින් අධිගනණය වී තිබූ බව නිරීක්ෂණය විය. | සන්සන්ධනාත්මක වටිනාකම තුළ දක්වා ඇති ශේෂයන් ඇතුළත්ව තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මුද්‍රණය කිරීමේදී අත්වැරදීමකින් එකී වටිනාකම මුද්‍රණය වී නොමැත. | නොවන ලෙස වගකීමෙන් කටයුතු කළ යුතු වේ. |
| (ආ) 2021 වර්ෂයට පෙර මිලදීගෙන තිබූ පරිගණක යන්ත්‍ර වලට අදාලව 2021 වර්ෂයේදී රු.1,077,778 ක් වැඩියෙන් ක්ෂය කර තිබුණද එම දෝෂය 2022 මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ දෝෂය සිදු වී ඇත. | විගණනය විසින් පෙන්වා දෙන අඩු පාඩු නිවැරදි කර ප්‍රවර්ථන වර්ෂය සඳහා ගිණුම් පිළියෙල කළ යුතු වේ. |
| (ඇ) 2021 වර්ෂයේදී ප්‍රවේශපත්‍ර යන්ත්‍ර රු. 5,393,206 කින් වැඩියෙන් ක්ෂය කර තිබූ අතර, එම දෝෂය නිවැරදි කිරීම සඳහා 2022 මූල්‍ය ප්‍රකාශන වල එයින් රු. 52,850 ක් පමණක් ගැළපීම් කර තිබූ අතර, ඉතිරි වටිනාකම වූ රු.5,340,356 ක් සඳහා ගැළපීම් සිදු නොකිරීම හේතුවෙන් සමුච්චිත පාඩුව එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | අදාළ දෝෂය සිදු වී ඇත. | නිවැරදි ක්ෂය වටිනාකම ගිණුම්වල ඇතුළත් කර සමුච්චිත ලාභය නිවැරදිව ගිණුම්වල අනාවරණය කළ යුතු වේ. |
| (ඈ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ යටතේ ගිණුම්ගත කර තිබූ රු.2,311,836,019 ක ඉතිරි කිරීමේ ගිණුම් ශේෂය කටුබැද්ද, මහරගම, මට්ටක්කුලිය හා ගාල්ල යන ඩිපෝවන්හි ඉතිරි කිරීම් ගිණුම්වල ශේෂ හා සංසන්දනය කිරීමේදී සමුච්චිත ශේෂය ලෙස රු.1,236,332 ක මුදලක් අඩුවෙන් දක්වා තිබුණි. | අදාල දෝෂය සිදුවී ඇති බව පිළිගනිමි .එම දෝෂය 2023 වර්ෂයේදී නිවැරදි කර ඇත. | මුදල් පාලනයෙහි දුර්වලතාවයක් බැවින් එය නිවැරදි කර ගිණුම් ගත කළ යුතු අතර ඉදිරියේදී එවැනි අඩුපාඩු සිදු නොවීමට වගබලා ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන ලාභය ගණනය කිරීමේදී 2022 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය වටිනාකමට ප්‍රවර්ථන වර්ෂයේ ගොඩනැගිලි ශේෂයට අදාළ ක්ෂය වටිනාකම වූ රු.9,705,106 ක අගය එකතු කර ප්‍රත්‍යාගණන ලාභය ගණනය කර නොතිබූ අතර, 2022 දෙසැම්බර් 31 දිනට ගණනය කරන ලද ප්‍රත්‍යාගණන ලාභය රු.20,976,927,250 ක් විය යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයෙහි සංචිත යටතේ පෙන්වා තිබූ ප්‍රත්‍යාගණන ලාභය රු.20,985,508,217 ක් විය. ඒ අනුව ප්‍රත්‍යාගණන ලාභය රු.8,580,967 කින් වැඩියෙන් පෙන්වා තිබුණි. | ගණනය කරන ලද ප්‍රත්‍යාගණන ලාභය වන රු.20,985,508,217 ක වටිනාකම හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය තුළ ඇතුළත් කර ඇත. එම වටිනාකම 2023 වර්ෂයේදී ක්ෂය අඩුකර සත්‍ය ප්‍රත්‍යාගණන ලාභය ලෙස ඉදිරිපත් කළ හැක. | නිවරැදිව ක්ෂය ගැලපීම් කර ප්‍රත්‍යාගණනය ලාභය ගණනය කර ගිණුම් ගත කළ යුතු වේ. |
| (ඊ) | රත්මලාන ඉන්ධන පිරවුම්හලේ දෛනික විකුණුම් වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඩීසල් විකුණුම් ආදායම රු.1,554,296 ක් වැඩියෙන් හා පෙට්‍රල් විකුණුම් ආදායම රු.12,338,750 ක් අඩුවෙන් පෙන්වා තිබීම හේතුවෙන් ඉන්ධන අලෙවියෙන් ලද මුළු ශුද්ධ ආදායම රු.10,784,454 කින් අඩුවෙන් පෙන්වා තිබුණි. | වර්ෂයේ සැබෑ විකුණුම් හා අවසන් ගිණුම් තුළ ඇති විකුණුම් අතර වෙනසට හේතු වනුයේ මුදල් නොලැබෙන තෙල් නිකුත් කිරීම්,CPC කූපන් මත ආයතන වලට නිකුත් කරන තෙල්, රත්මලාන ඩිපෝවට බැංකු යෑමට ඉන්ධන පිරවුම් හලේ මෝටර් බයික් හා ජෙනරේටර් සඳහා තෙල් නිකුත් කිරීම් ගිණුම්ගත නොවීමත් හා කලින් චෙක්පත් තැන්පත් කර තෙල් ලබාගන්නා ආයතන ලබාගත් තෙල් සම්බන්ධ නිවැරදි වටිනාකම් ගිණුම් ගත නොකිරිම. | විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් යටතේ ආදායම් නිසි පරිදි හඳුනාගෙන නිවැරදි අගය ගිණුම්ගත කළ යුතු වේ. |
| (උ) | රත්මලාන ඉන්ධන පිරවුම්හලේ මාසිකව සකස් කරනු ලබන දෛනික විකුණුම් විස්තරයට අනුව මාසය අවසානයේ ඉතිරි ඉන්ධන තොගය, සත්‍ය ඉන්ධන තොගය හා සංසන්දනය කිරීමේදී රු.4,876,320 ක වටිනාකමින් යුත් ඩීසල් ලීටර් 15,421.96 ක හා රු.2,647,897 ක වටිනාකමින් යුත් පෙට්‍රල් ලීටර් 8,349.46 ක ඌණතාවය හේතුවෙන් එකතුව රු.7,524,217 ක වටිනාකමින් යුත් වාර්ෂික අවසන් තොගය අඩුවෙන් පෙන්වීම තුළ සමාලෝචිත වර්ෂයේ ලාභය එම | ඉන්ධන තොගයන්හී ශේෂයෙහි පොත් අගය පසු දින ඉන්ධන නිකුත් කිරීමේ ආරම්භයේදී ආරම්භක තොගය ලෙස සැළකිය යුතු වුවද ප්‍රායෝගිකව සිදුව ඇත්තේ ගිල්වුම් කෝදුවෙහි සටහන අනුව ඊට අදාළ පරිමාව එදින ආරම්භක තොගය ලෙස සටහන් කර තිබීමයි. | පවත්නා සත්‍ය ඉන්ධන තොගයට අනුව අවසන් තොග ආගණනය කර ගිණුම් ගත කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| ප්‍රමාණයෙන් අඩුවෙන් නිරූපණය වන බව නිරීක්ෂණය විය. | | |
| (ඌ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.277,733,205 ක් පෙන්වා තිබූ අතර ගිණුම් සටහන් වල සහ ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ මෙම ශේෂය රු.335,325,734 ක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.57,592,529 ක් අඩුවෙන් සටහන් වී තිබූ බව නිරීක්ෂණය විය. | ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ රු.335,325,205 ක් ලෙස සටහන් කර ඇති ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ පෙර වර්ෂයට අදාල ගැලපීම් රු.277,733,205 ක් හා කල්බදු වටිනාකම් වෙනස්වීම් යටතේ සිදු කර ඇති ගැලපීම් රු.57,592,000 ක් ලෙස ඇතුළත් කර ඇත. | කල් බදු වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ වෙන වෙනම අනාවරණය කර නොමැති බැවින්, මෙවැනි දෝෂ ඇතිවීම වැළැක්වීම සඳහා කටයුතු කළ යුතු වේ. |
| (එ) මට්ටක්කුලිය ඩිපෝව විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමට අදාලව 2022 දෙසැම්බර් 31 දිනට සකස් කරන ලද බැංකු සැසඳුමට අනුව මුදල් පොතෙහි බැංකු ශේෂය ලෙස රු.20,109,442 ක අයිරාවක් පෙන්නුම් කළද එය අවසන් ගිණුම්වල රු.9,184,280 ක අයිරා ශේෂයක් ලෙස පෙන්වා තිබුණි. එම නිසා අවසන් ගිණුම්වල බැංකු අයිරා ශේෂය රු. 10,925,162 ක් අඩුවෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය විය. | අදාල දෝෂය සිදු වී ඇති බව පිළිගනිමි. | බැංකු ශේෂයන්හි දෝෂ සමාලෝචිත වර්ෂයේ මුදල් ශේෂයට බලපාන බැවින් මෙවැනි දෝෂ සිදු නොවීමට වග බලා ගත යුතු වේ. |

### 1.5.5 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූලාශ්‍ර ප්‍රකාශන අනුව වටිනාකම (රු.) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.) | වෙනස (රු.) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට යන්ත්‍ර උපකරණ, මෝටර් වාහන, කාර්යාල උපකරණ, පරිගණක යන්ත්‍ර, බස් රථ, ප්‍රවේශ පත්‍ර යන්ත්‍ර හා වෙනත් වත්කම් වලට අදාලව අවසන් ගිණුමේ දක්වා තිබූ ශේෂය හා උප | 13,615,181,245 | 10,926,969,902 | 2,688,211,342 | 2017 වර්ෂයේ සිට 2022.12.31 වන දිනට ලෙජර් ගිණුමේ ශේෂය නිවැරදි වන බවත් අදාල ස්ථාවර වත්කම් උප ලේඛනය නිවැරදි ආකාරයට යාවත්කාලී | උප ලේඛණවල ශේෂ යාවත්කාලීන කර නිවැරදිව ගිණුම්වලට ගත යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| ලේඛනයන්ට අනුව ශේෂය අතරරු.2,688,211,342 ක වෙනසක් පැවතිය ද එය නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි. | | | න නොවීම මත මෙම දෝෂය සිදුවී ඇති බවත් පිළිගනිමි. | |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල (රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතු වටිනාකම රු.11,384,538,382 ක් වූ වත්කම්, බැරකම් හා බැංකු ශේෂ වල ඇතුළත් රු.1,290,782,782 ක වටිනාකමින් යුත් ක්‍රියාත්මක නොවන ගිණුම් ශේෂ සඳහා ශේෂ තහවුරු කිරීම් සහ විස්තරාත්මක උප ලේඛන ද, රු.4,156,211,492 ක වටිනාකමින් යුත් කොටස් ප්‍රාග්ධනය සඳහා කොටස් සහතික සහ ශේෂ සනාථ කිරීම් ද, රු.156,195,337 ක වටිනාකමින් යුත්, ස්ථාවර වත්කම් සඳහා වත්කම් වර්ගය හා විස්තරාත්මක උප ලේඛන ද, රු.753,363,548 ක වටිනාකමින් යුත් ස්ථාවර තැන්පතු සහ ආයෝජන වල ස්ථාවර තැන්පත් සහතික පත් ද, රු.4,571,242,599 ක වටිනාකමින් යුත් වෙළඳ ණයහිමියන් පිළිබඳ විස්තරාත්මක උප ලේඛන හා ශේෂ සනාථ කිරීම් ද, රු.89,191,198 ක වටිනාකමින් යුත් වෙළඳ ණයගැතියන් හා මාර්ගස්ථ මුදල් සඳහා ශේෂ සනාථ කිරීම් හා විස්තරාත්මක උප ලේඛන ද, රු.267,951,474 | 11,384,538,382 | ශේෂ තහවුරු කිරීම, විස්තරාත්මක උප ලේඛණ, කොටස් සහතික,ස්ථාවර තැන්පතු සහ ආයෝජනවල සහතික, ශේෂ සනාතන, කාල විග්‍රහයන්, බැංකු සැසඳුම් හා බැංකු ප්‍රකාශන | ගිණුම් ශේෂයන්ට අදාල විස්තර හා උප ලේඛණ ඉදිරිපත් කර නොමැති බව පිළිගනිමි. ඉදිරි විගණන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමට කටයුතු කරමි. | විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලද සාක්ෂි අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේදී ගිණුම් සමඟ විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| ක වටිනාකමින් යුත් ඉදිරියට ගෙවූ වියදම් සඳහා කාල විග්‍රහයන් හා සබරගමුව හා නැගෙනහිර ප්‍රාදේශික වලට අයත් ජංගම ගිණුම් 23 කට අදාළ රු.7,551,643 ක හර ශේෂ සහ රු.92,048,309 ක බැර ශේෂ සඳහා බැංකු සැසඳුම්, බැංකු ප්‍රකාශ හා ශේෂ සනාථ කිරීමේ ලිපි ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | | | |
| (ආ)සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් ජංගම නොවන බැරකම් යටතේ නිරවුල් නොකළ ශ්‍රී ලංගම සේවක අර්ථ සාධක අරමුදල් ලෙස ගෙවිය යුතු ගිණුම් ශේෂයක් පෙන්වා තිබූ අතර, එම ශේෂය වසර 06 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයක් බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් එවැනි සේවක අර්ථසාධක මුදලක් ගමනාගමන මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදලට සත්‍යවශයෙන්ම ගෙවිය යුතු ශේෂයක් බව සනාථ කර ගැනීම සඳහා වූ කිසිඳු සාක්ෂියක් විගණනය වෙත ඉදිරිපත් නොවිය. | 1,860,824,837 | සනාථ කර ගැනීම සඳහා වූ ලිඛිත සාක්ෂි එනම් විස්තරාත්මක උප ලේඛන හා ශේෂ සනාථ. | මෙය ගිණුම්කරණ සටහන් තැබීමේදී සිදුවී ඇති දෝෂයක් බව නිරීක්ෂණය වන අතර ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශයෙන් එම දෝෂ නිවැරදි කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. | මෙහෙයුම් නොවන මෙවැනි සාවද්‍ය ගිණුම් ශේෂ විධිමත් පරිදි ගිණුම් වලින් ඉවත් කර ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට වෙනත් ලැබිය යුතු ආදායමක් ලෙස පෙන්වා තිබූ රු.1,549,623,472 ක පොලිස් බලපත්‍ර ශේෂය තුළ වසර 10 ඉක්මවූ රු.44,957,258 ක් ද වසර 05 ත් 10 ත් අතර රු.91,395,964 ක ශේෂයක් ද වසර02 ත්05 ත් අතර රු.120,493,842ක ශේෂයක් පැවතිය ද එම ශේෂ අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමර්ග ගෙන නොතිබුණි. | මුදල් වර්ෂයට අදාළ සියළුම පොලිස් වවුචර් සඳහා ලැබිය යුතු මුදල නොලැබෙන අතර ඒ හේතුවෙන් ඩිපෝවෙහි ගිණුම් වාර්තා නිවැරදි ලෙස පවත්වාගෙන යාමට නොහැකිවී ඇත. එමෙන්ම ප්‍රධාන කාර්යාලය වෙත පොලිස් මූලස්ථානයෙන් | ලැබිය යුතු පොලිස් බලපත්‍ර ශේෂය තුළ වසර දෙකට වැඩි අය නොවූමුදල් ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | ලැබෙන මුදල ඒ ඒ ඩිපෝවන්ට අදාළව ගෙවිය යුතු මුදල ලෙස බෙදාහැරීමක් සිදු නොවන බැවින් ගිණුම් කටයුතු වල දෝෂ සිදුවන බව නිරීක්ෂණය වී ඇත. | |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමි ශේෂය තුළ හා වෙනත් ණය හිමි ශේෂය තුළ වසර 02 ක කාලය ඉක්ම වූ පිළිවෙලින් රු.1,495,204,034 හා රු.90,864,377 ක් වශයෙන් එකතුව රු.1,586,068,411 ක් වූ නොපිය වූ ණය ශේෂයක් තිබුණි. | සැපයුම්කරුවන් විසින් අදාළ සනාථන ලිපි ලබා නොදීම හේතුවෙන් මෙම ශේෂයන් නිවැරදි කිරීමට නොහැකි වී ඇත.දීර්ඝ කාලයක සිට පැවත එන මෙම ශේෂයන් පිළිබඳව ප්‍රාදේශීය මට්ටමෙන් අවශ්‍ය විස්තර ගෙන්වා ගෙන ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | වසර දෙකක කාලය ඉක්මවා ඇති එම ණයහිමි ශේෂයන් පියවීමට කටයුතු කර ගිණුම් යාවත්කාලීන කළ යුතු වේ. |
| (ආ) 2022 දෙසැම්බර් 31 දිනට රු.3,522,347,457 ක් වූ වෙළඳ ණයහිමි ශේෂය තුළ ඉන්ධන පිරවුම්හල් වල පැවති රු.21,698,022 ක හර ශේෂයක් ඇතුළත් කිරීම හේතුවෙන් ගිණුම්ගත කර තිබූ ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ණයහිමි ශේෂ තුළ වැරදීමකින් ණයගැති ශේෂයක් ඇතුළත් වී ඇති අතර, 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු සලසා ඇත. | වසර දෙකට වඩා වැඩි ණයහිමි ශේෂ නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීම හෝ ඒ සඳහා ගිණුම්වල වෙන් කිරීම් සිදු කළ යුතු වේ. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සේවක අර්ථසාධක අරමුදලට දායක වීම් ලෙස ගෙවීම් නොකළ ශේෂය රු.256,503,445 ක් වූ අතර එම ශේෂය තුළ වසර 10 ට වැඩි රු.37,041,436 ක් ද, වසර 05 ත් 10 ත් අතර රු.191,712,461 ක ශේෂයක් සහ වසර 02 ත් 05 ත් අතර රු.7,850,445 ක ශේෂයක් ද තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් මණ්ඩලය විසින් පවත්වාගෙන යන සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් ගෙවූ දත්ත අනුව තවදුරටත් හඳුනා නොගත් බැර ශේෂය ගෙවීම් කළ යුතු සත්‍ය බැර ශේෂයක් ද යන්න පිළිබඳව විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | නොගෙවන ලද ශේෂයක් ලෙස විගණනය විසින් හඳුනාගෙන ඇති රු.මි.256.5 ක මුදල ගිණුම්කරණ දෝෂ නිසා ගිණුම් වාර්තා වල පෙන්නුම් කළද කම්කරු කාර්යාලයේ වාර්තා අනුව ශ්‍රී ලං.ග.ම. විසින් 2022 වර්ෂයට ගෙවිය යුතු සියළුම ගෙවීම් සිදුකර ඇත. | සේවක අර්ථසාධක අරමුදල් ශේෂය තුළ පවත්නා හිඟ ශේෂ නිසි පරිදි හඳුනාගෙන ගෙවිය යුතු ශේෂ ගෙවා නිම කිරීමටත් සාවද්‍ය ගිණුම් ශේෂ විධිමත් පරිදි ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු වියදම් යටතේ පෙන්වා තිබූ මෙහෙයුම් නොවන ගිණුම් 13 කට අදාලව රු.1,084,753,124 ක වටිනාකමින් යුත් ශේෂයක් පැවති බව නිරීක්ෂණය විය. | අතීතයේ සිට පැවත එන ශේෂයන් බැවින්, ඒවා සනාථ කර ගැනීමට කිසිදු හැකියාවක් නොමැත. | හඳුනාගත නොහැකි ශේෂ විධිමත් පරිදි ගිණුම්වලින් ඉවත් කිරීමට හෝ ඒ සඳහා වෙන් කිරීම් සිදු කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට දේශීය මිලදී ගැනීම් අත්තිකාරම් ගිණුමෙහි රු.1,378,085,248 ක ශේෂයක් පැවති අතර, ඒ සඳහා උප ලේඛන ලබා නොදීම හේතුවෙන් එහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි වූ අතර, ඉන් රු.1,373,773,207 ක ශේෂයක් වසර 02 ත් 10 ත් අතර කාලයක සිට පැවත එන බව අනාවරණය විය. | අදාල දෝෂය සිදුවී ඇත. මෙම අත්තිකාරම් ගිණුමේ ශේෂය සමන්විත වන්නේ 2011 වර්ෂයේ සිට 2014වර්ෂය දක්වා සිදු කරන ලද අත්තිකාරම් ගෙවීම් වලිනි.අත්තිකාරම් පියවීමට අදාල මූලාශ්‍ර ලේඛන පරීක්ෂාකර බලා අත්තිකාරම් ගිණුමේ ශේෂය පියවීමට කටයුතු කරමින් පවතී . | අදාළ ශේෂයන් නිවැරදිව හඳුනාගෙන අක්‍රිය ශේෂ ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන නිලධාරියෙකු විසින් මණ්ඩලයට, වෙන් කළ වාහන කුලියට ලබා දුන් ආයතනය හරහා තම පෞද්ගලික වාහනය මණ්ඩලයට ලබා දී ඒ සඳහා මාසික කුලිය ලෙස රු.39,850 බැගින් 2020 ජනවාරි 22 දින සිට 2022 මැයි 31 දින දක්වා රු.1,116,331 ක මුදලක් ලබා ගෙන තිබූ බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | මෙවැනි ගණුදෙණු සිදුවීම වළක්වාලීමට කටයුතු කළ යුතු වේ. |

## 1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත 39(2) වගන්තිය | ජාතික විගණන පනතේ 11 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපතිවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලද විස්තරාත්මක කළමණාකාරන විගණන වාර්තාව ලැබීමෙන් පසු ඒ පිළිබඳව දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව | පිළිතුරු ලබා දී නොමැත. | විස්තරාත්මක කළමණාකාරණ විගණන වාර්තාව ලැබී මාස 03 ක් ඉක්මවීමට ප්‍රථම පිළිතුරු ලබාදිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාත්මක කිරීමේ හෝ නොකිරීමේ හේතු ඇත්නම් ඒ පිළිබඳව මාස 03 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත හේතු ඉදිරිපත් කළ යුතු බැවින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි කටයුතු පිළිබඳව 2022 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව සඳහා 2023 ජුනි 12 දින තෙක් පිළිතුරු ලබා දී නැත. | | |
| (ආ) 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත 6 (2) (අ) | මාසික වැටුප් ලබන සේවකයකු ඔහු විසින් අන්තිමට ලබා ගන්නා ලද මාසික වැටුපේ අනු ප්‍රමාණයට අනුව ආගණනය කරන ලද මාසික වැටුපෙන් අඩක් පාරිතෝෂික ලෙස ගෙවිය යුතු වුවත් 2005 වර්ෂයට පෙර සේවයට බඳවා ගත් සේවකයින් සඳහා පාරිතෝෂික ගෙවීමේදී ඔහු විසින් අවසන් වරට උපයා ගත් සම්පූර්ණ වැටුප වර්ෂ ගණනින් ගුණකර පාරිතෝෂික ගෙවා තිබූ අතර, පාරිතෝෂික ගෙවීමේදී සේවකයා විසින් අවසන් දිනට උපයා ගත් මාසික වැටුප සේවය කළ වසර ගණනින් ගුණකර ගෙවීම් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.319,689,152 ක මුදලක් පාරිතෝෂික වශයෙන් වැඩියෙන් ගෙවා තිබුණි. | ශ්‍රී ලංගම විසින් විවිධ කාලයන්හි ගත් තීරණ අනුව පාරිතෝෂික ගෙවීම සම්බන්ධව චක්‍රලේඛන නිකුත් කර ඇත. ඒ අනුව 2005.10.18 දිනට පෙර බඳවා ගත් නිලධාරීන් සඳහා මාසික වැටුප පදනම් කර පාරිතෝෂික ගෙවීම් කළ අතර, අතීතයට බලනොපාන ලෙස චක්‍රලේඛ නිකුත් කිරීමට නොහැකි බවට කම්කරු කොමසාරිස් විසින් 2020.01.07 සහ 2021.02.09 දිනැති ලිපි වලින් දී ඇති පැහැදිලි කිරීම් අනුව පාරිතෝෂික ගෙවීම් ක්‍රියාපටිපාටිය වෙනස් කර ඇත. | පනතේ විධිවිධාන වලට පටහැනිව කරන ලද සාවද්‍ය ගෙවීම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. මු. රෙ. 105 | පිරිවැය රු.1,041,195 ක් වූ හානි වූ මෝටර් වාහන සම්බන්ධයෙන් හා 2022 මැයි 09 දින සිදු වූ කලබලකාරි සිද්ධියේදී හානියට පත් බස් රථ හා වාහන වල වටිනාකම වූ රු.12,136,724 ක මුදල සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි | ප්‍රාරම්භක වාර්තාවක් හෝ පූර්ණ වාර්තාවක් නොමැතිවීම හේතුවෙන් ආරක්ෂක අංශයෙන් ලබාදී ඇති මූලික විමර්ෂණ | හානිය නිසි පරිදි හඳුනාගෙන වගකිව යුත්තන්ගෙන් අය කිරීමට හෝ ප්‍රතිපූර්ණය |

| | | | | |
|---|---|---|---|---|
| | | විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | වාර්තාවේ වටිනාකම තහවුරු කර ගැනීම, වගකිවයුත්තන් හඳුනාගැනීම හා අදාළ වාහන වල රාජකාරී ගමන් ස්වභාවය, රක්ෂණ සමාගම් මඟින් ලබාගත හැකි හානි පූර්ණ වටිනාකම, අළුත්වැඩියාව සඳහා වන වියදම් ඇස්තමේන්තු වැනි කරුණු අවසන් කර ගැනීමකින් තොරව මු.රෙ.105 අනුව කටයුතු කිරීම බාධාවක්වී ඇත. | කිරීමට කටයුතු කළ යුතු වේ. |
| ii. | මු. රෙ. 225 | සියළුම ගෙවීම් සඳහා අවශ්‍ය වවුචර් නියමිත ආකෘති පත්‍රවල නිවැරදි ලෙසත්, සම්පූර්ණ ලෙසත්,පුරවා ගෙවීම් සඳහා ඉදිරිපත් කළ යුතුවේ. නමුත් 2022 ජුලි මස 07 දින සිට 15 දින දක්වා අමතර කොටස් හා ඉන්ධන මිලදී ගැනීම සඳහා මට්ටක්කුලිය ඩිපෝව මගින් චෙක්පත් 14 කට ගෙවීම් කරන ලද රු.25,588,202 ක මුදලක් සනාථ කිරීම සඳහා වූ ගෙවීම් වවුචර් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | වවුචර් නිසි පරිදි අදාල ලිපි ගොනුවේ ඇතුළත්ව ඇත. 2023.05.31 ට පෙර විගණනය වෙත ඉදිරිපත් කරන ලෙස සහාකාර කළමනාකාර (මුදල්) වෙත ලිඛිතව උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි විධිවිධානවලට යටත්ව වවුචර් පිළියෙල කර අදාළ පද්ධතියට ඇතුළත් කළ යුතු වේ. |
| iii. | මු.රෙ. 387 | කිසිම රජයේ බැංකු ගිණුමකින් අයිරා ලබා ගැනීම තහනම් වුවත් මණ්ඩලය විසින් 2022 දෙසැම්බර් 31 දිනට රු.645,939,849 ක අයිරාවක් පවත්වාගෙන ගොස් තිබූ අතර, ඒ සඳහා අයිරා පොලිය ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.400,171 ක මුදලක් ගෙවා තිබුණි. | වවුචර් නිසි පරිදි අදාල ලිපි ගොනුවේ ඇතුළත්ව ඇත. 2023.05.31 ට පෙර විගණනය වෙත ඉදිරිපත් කරන ලෙස සහාකාර කළමනාකාර (මුදල්) වෙත ලිඛිතව උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි විධිවිධානවලට යටත්ව වවුචර් පිළියෙල කර අදාළ පද්ධතියට ඇතුළත් කළ යුතු වේ. |
| iv. | මු. රෙ. 395 (ඇ) | බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේදී දී ඇති ගණුදෙනු තත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත්, ප්‍රාදේශීය කාර්යාල 03 ක හා ඩිපෝ 03 ක මහජන බැංකුවේ හා ලංකා | 2020 වර්ෂයේ සිට ශ්‍රී ලං.ග.ම. තුළ ක්‍රියාත්මක වන සියළුම ගිණුම්කරණ ඒකක සඳහා බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ කටයුතු Sage | දෙසැම්බර් 31 දිනට වූ බැංකු සැසඳුම් නිවැරදිව සකස් කර අවසන් ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන සමඟ |

| | | | | |
|---|---|---|---|---|
| | | බැංකුවේ පවත්වාගෙන යන ගිණුම් 07 කට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | Accpack මෘදුකාංගය මඟින් සකස් කරනු ලබන අතර,සෑම බැංකු සැසඳුමක්ම ඊළඟ මස 10 වන දිනට පෙර සකස් කරනු ලබයි. | විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වේ. |
| v. | මු. රෙ.395 (ඇ) | 2022 දෙසැම්බර් මස සකසන ලද බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.57,942,422 කට අදාළ ඩිපෝ 12 ක මුදල් නොවූ චෙක්පත් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදාල දෝෂය සිදුවී ඇති බව පිළිගනිමි. | අදාළ චෙක්පත් වටිනාකම ආදායමට බැර කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |
| vi. | මු.රෙ. 396 (අ) (i) හා (iii) | වටිනාකම රු.5,407,762 ක් වූ ඩිපෝ සහ ආයතනවල ගෙවීම් සිදුකළ චෙක්පත් 163 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල දෝෂය සිදුවී ඇති බව පිළිගනිමි. | මුදල් රෙගුලාසි විධිවිධාන අනුව චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතනය සංග්‍රහය | | | | |
| i. | XXV වැනි පරිච්ඡේදයේ 5.2 හා 5.3 වගන්තිය | වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කරන ලද නිලධාරියෙකුගේ වැටුප් හා ජීවන වියදම් දීමනාව රජය විසින් ගෙවනු ලබන අතර, ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවන්නෙක් නම් රජයේ දායක මුදල් කොටස සංගමය විසින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුවේ. නමුත් එම මුදල් වෘත්තීය සමිති විසින් නොව මණ්ඩලය විසින් ගෙවනු ලබන බව නිරීක්ෂණය විය. එවැනි නිලධාරියෙකුට වැටුප් හා දීමනා වලට අමතර සේවය වෙනුවෙන් වෙනත් කිසිදු දීමනාවකට හිමිකම් නොමැති වුවත් 2022 දෙසැම්බර් දක්වා වෘත්තීය සමිති 07 ක නිලධාරීන් 28 දෙනෙකුට ප්‍රසාද දීමනා හා දිරි දීමනා ලෙස පිළිවෙලින් රු.1,053,100 හා 10,661,547 ක් වශයෙන් එකතුව රු.11,714,647 ක මුදලක් ගෙවා තිබුණි. | විගණන නිරීක්ෂණයට එකඟවුවද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය දෙපාර්තමේන්තුවක් නොවන අතර අර්ධ රාජ්‍ය ආයතනයකි. එබැවින් ආයතන සංග්‍රහයේ විධි විධාන සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොකරයි. | සාවද්‍ය ලෙස කරන ලද ගෙවීම් අය කර ගැනීමට හෝ ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| ii. XXV පරිඡේදයේ 4.2. වගන්තිය | යථෝක්ත වගන්තියේ විධිවිධාන වලට පටහැනිව මණ්ඩලයේ වෘත්තීය සමිති 05 ක් වෙනුවෙන් වැඩිපුර සේවකයින් 12 දෙනෙකු වෘත්තීය සමිති කටයුතු සඳහා මුදාහැර තිබූ අතර, සමස්ථ ලංකා එක්සත් මෝටර් කම්කරු සමිතියේ සාමාජිකයෙකුට 2006 වර්ෂයේ සිට වැටුප් හා ප්‍රසාද දීමනා වශයෙන් රු.3,190,410 ක මුදලක් ගෙවා තිබූ අතර, එම සමිතියේම තවත් නිලධාරියෙකු ද නිදහස් කර තිබූ අතර, ඔහුටද වැටුප් හා ප්‍රසාද දීමනා වශයෙන් රු.772,938 ක මුදලක් ගෙවා තිබුණි. | නිලධාරීන් දෙදෙනෙකුට පමණක් නොව නිදහස් කර ඇති 34 දෙනාටම නිදහස් කර ඇති කාලය තුළ මණ්ඩලීය සම්ප්‍රදායන් අනුගමනය කරමින් මෙම ක්‍රමය ක්‍රියාත්මක වී ඇත. මෙලෙස නිදහස් කිරිමේ ක්‍රමවේදයෙහි අක්‍රමවත් බව ඉවත් කිරිම සඳහා දැනට සකස් වෙමින් පවතින මණ්ඩලීය පාලන පිළිවෙත් සංශෝධනයේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | පෙන්වා ඇති නිලධාරීන් ඇතුළු නිදහස් කර ඇති සියලු දෙනා සඳහා පටහැනිව කරන ලද ගෙවීම් අය කර ගැනීමට හෝ ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ. |
| iii. XXV පරිච්ඡේදයේ 6.1 වගන්තිය | වෘත්තීය සමිති කටයුතු සඳහා මුදාහරිනු ලබන නිලධරයන්ට තම වෘත්තීය සමිති කටයුතු සඳහා දිවයිනේ ඕනෑම ස්ථානයකට ගමන් කිරීම සඳහා හිමිකම පවතිනුයේ නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර හා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ නිදහස් ප්‍රවේශ පත්‍ර පමණි. එසේ වුවද ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන වලට පටහැනිව මණ්ඩලයෙන් වෙන් කර තිබූ වාහන 03 කට හා පෞද්ගලික වාහන 03 කට 2022 වර්ෂයේදී ඉන්ධන හා අළුත්වැඩියා වියදම් ලෙස මණ්ඩලයේ මුදලින් රු.4,782,305 ක මුදලක් වැය කර තිබුණි. | අළුත්වැඩියා කටයුතු සඳහා වාහන 03 ක් වෙනුවෙන් දරන ලද වියදම නිවැරදි වන අතර ඉන් වාහන 02 ක් පමණක් වෘත්තීය සමිතිනියෝජිතයින්ට ලබාදී ඇති බව පිළිගනිමි. එම නියෝජිතයන් සහ පුද්ගලික වාහන භාවිතා කරන වෘත්තීය සමිති නියෝජිතයන්ට මසකට ඉන්ධන ලිටර් 115 බැගින් ලබාදීමට ශ්‍රී ලං.ග.ම. පාලනාධිකාරිය මඟින් කටයුතු කර ඇති බව පිළිගනිමි. | වෘත්තීය සමිති කටයුතු සඳහා ලබා දී ඇති වාහන ආපසු ලබා ගෙන රාජකාරි අවශ්‍යතා සඳහා භාවිතා කළ යුතු වේ. |
| (ඉ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රාජකාරි සඳහා සේවයට වාර්තා කරන නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම තහවුරු කිරීම සඳහා, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු අතර, තම රාජකාරියට අමතරව ඇමතුම් රාජකාරි වැනි නිශ්චිත රාජකාරි සඳහා කාර්යාලයට වාර්තා කරන නිලධාරීන් ද, ඔවුන්ගේ පැමිණීම ඇඟිලි සලකුණු | වයරින් පද්ධති මුළුමනින්ම අක්‍රිය මට්ටමේ පැවති අතර වයරින් පද්ධතිය පිළිසකර කිරීම සඳහා රු.369,600 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් විය. මේ වන | පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයෙන් සටහන් කළ යුතු අතර අතිකාල ගෙවීමේදී වේලාවන් තහවුරු |

| | | | |
|---|---|---|---|
| | යන්ත්‍ර මගින් සනාථ කළ යුතු වේ. නමුත් ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල හා ඩිපෝවන්හි 2019 වර්ෂයේ සිට පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. මේ හේතුවෙන් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම්වල නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. තවද ප්‍රධාන කාර්යාලයෙහි ඇති ඇඟිලි සලකුණු යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා 2022 වර්ෂයේදී රු.369,600 ක මුදලක් ද වැයකර ඇතත් ඒවා තවදුරටත් ක්‍රියාත්මක තත්වයට පත්කර නොමැති බව නිරීක්ෂණය විය. | විටත් ශ්‍රී ලං.ග.ම. සඳහා නව යන්ත්‍ර 250 ක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. සේවකයන්ගේ පැමිණීම මෙන්ම අතිකාල ගෙවීම් සඳහා කාලය ගණනය කිරීම් නිවැරදිව කරගැනීමට ඇති හැකියාව පිළිබඳව ගැටළු නිර්මාණයවී ඇති බවද පිළිගනිමි. | කර ගැනීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු වේ. |
| (ඊ)රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 1/2015 | යථෝක්ත චක්‍රලේඛයේ 3.1 වගන්තියෙහි ඇතුළත් වගුවේ 4 වගන්තිය අනුව, 2006 වසරේ නිකුත් කරන ලද කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක MSD 30 ප්‍රකාරව HM 1-1 ගණයේ හෝ ඊට ඉහළ එම දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද තනතුරක් දරණ වෙනත් ඕනෑම නිලධාරියෙකුට වර්තමාන සංශෝධනයට අනුව නිල වාහන භාවිතා කිරීමට හිමිකම් ඇති ඉන්ධන ප්‍රමාණය ලීටර් 115 ක් වුවද ඩිපෝ කිහිපයක ඩිපෝ අධිකාරි ඇතුළු නිලධාරීන් භාවිතා කරන වාහන වලට 2022 වර්ෂයේ එම සීමාව ඉක්මවා ඉන්ධන ලබා ගෙන තිබූ අතර ඒ සඳහා වැය කර තිබූ මුදල රු.2,747,405 ක් විය. | නිලධාරීන් රාජකාරී ගමන් සඳහා ලබාගත් ඉන්ධන ප්‍රමාණය පිළිබඳවත් ඔවුන් ගමන් ගත් ආකාරයත් ලබා ගත් ඉන්ධන රාජකාරී කටයුතු සඳහා භාවිතා කළේද යන්න පිළිබඳව සොයා විධිමත් වාර්තාවක් ලබා ගැනිමෙන් අනතුරුව රාජකාරී කටයුතු වලින් පරිබාහිර කටයුතු සඳහා ඉන්ධන ලබාගෙන ඇත්නම් එය අය කිරීමට කටයුතු කරන බව දන්වමි. | වැඩියෙන් ලබා ගෙන ඇති ඉන්ධන වලට අදාළ පිරිවැය අදාල පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (උ)1997 සැප්තැම්බර් 29 දිනැති අංක 15/97 දරණ පරිපාලන චක්‍රලේඛය | වෘත්තීය සමිති කටයුතු සඳහා පූර්ණ කාලීනව නිදහස් කරන සේවකයන් වසර 04 ක කාලයකින් පසු නැවත පූර්ණ කාලීනව නිදහස් කරනු ලබන්නේ නම් ඒ සඳහා ගරු අමාත්‍යවරයාගේ නිර්දේශය ලබා ගත යුතු වුවත්, වෘත්තීය සමිති 06 ක වසර 04 ක කාලය ඉක්ම වූ නිලධාරීන් 13 දෙනෙකු තවදුරටත් නීතියට පටහැනිව පූර්ණ කාලීනව නිදහස් කර තිබූ බව නිරීක්ෂණය විය. | දැනට මණ්ඩලීය පාලන පිළිවෙත් ක්‍රියාත්මක වනුයේ 100% ආයතන සංග්‍රහයට අනුකූලව නොවන අතර වෘත්තීය සමිති නිලධාරීන් 13 දෙනා වසර 04 කට වැඩි කාලයක් වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කර තිබීම ආයතන සංග්‍රහයට අනුව පටහැනි වුවද මණ්ඩලීය පිළිවෙත් | අවිධිමත් ලෙස සිදු කර ඇති නිදහස් කිරීම් නවතා දැනට වෘත්තීය සමිති කටයුතු සඳහා නිදහස් කර ඇති සේවකයින් රාජකාරි කටයුතු සඳහා අනුයුක්ත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | අනුව ඒ පිළිබඳ ඍජු උපදේශයක් නොමැති බැවින් ඔවුන් තවදුරටත් එලෙස නිදහස් කර ඇත. | |
| (ඌ)2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ චක්‍රලේඛ අංක 30/2006 | ශ්‍රී ලංගම ප්‍රාථමික, මධ්‍යම හා ඉහළ කළමණාකාරිත්වය තුළ සේවය කරනු ලබන Iශ්‍රේණියේ සිට VIII ශ්‍රේණිය දක්වා වන නිලධාරීන්ගේ වැටුප් කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 චක්‍රලේඛයේ වැටුප් කාණ්ඩ අනුව 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කිරීමට නියම කර ඇතත් 2022 දෙසැම්බර් 31 දින තෙක් I ශ්‍රේණියේ සිට VIII ශ්‍රේණිය දක්වා වූ නිලධාරීන් 3,050 කගේ වැටුප් අදාළ පියවරේ තබා සංශෝධනය කර නොතිබීම හේතුවෙන් වැටුප් හා දීමනා වශයෙන් ගෙවන ලද රු.1,077,109,440 ක මුදලෙහි නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ I ශ්‍රේණියේ සිට VIII ශ්‍රේණිය දක්වා වන කාණ්ඩ වල සේවකයන් හා නිලධාරීන්ට එම චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ක්‍රම අනුමතවී නොමැත. කෙසේ වෙතත් 2022.09.28 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ චක්‍ර ලේඛයට අනුව 2023 මාර්තු මස සිට වැටුප් සකස් කරන අතර වැටුප් ගෙවීමේදී වැඩිපුර ගෙවීමක් සිදුව තිබුනහොත් එය අදාළ නිලධාරියාගෙන් අයකර ගැනිමට හෝ වැටුප් හා දීමනා අඩුවෙන් ගෙවා තිබුණහොත් අදාළ හිඟ වැටුප් හා දීමනා ගෙවීමටත් හැකිවන පරිදි තීරණයක් ගෙන ඇත. | නිවැරදිව හා චක්‍රලේඛ විධිවිධාන අනුව වැටුප් සකස් කළ යුතු වේ. |

## 1.9 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු ඩිපෝ 36 ක තිබූ රු.23,348,867 ක හර ශේෂ සහ රු.165,336,690 ක අයිරා ශේෂ සහිත ජංගම ගිණුම් 40 ක් වෙනුවෙන් බැංකු ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ඒ හේතුවෙන් එකී ජංගම ගිණුම් වලට අදාළව සකස් කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශන වල නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | සම්පූර්ණ මූල්‍ය වර්ෂයම සඳහා බැංකු ප්‍රකාශණ ගිණුම්කරණ සටහන් සහ අනෙකුත් ලේඛන සමඟ ලබාදෙන ලෙස සියළුම ඩිපෝවන් වෙත උපදෙස් ලබාදී තිබුණද , මෙම ඩිපෝ 36හි ගණකාධිකාරීන් විසින් එම උපදෙස් අනුගමනය කර නොමැත. | ගිණුම් ඉදිරිපත් කිරීමේදී ගිණුම් සටහන් සමඟ මූල්‍ය ප්‍රකාශන හා බැංකු සැසඳුම් ඉදිරිපත් කළ යුතු වේ |

| | | |
|---|---|---|
| (ආ) ගිංතොට පෙට්ටිගලවත්ත ප්‍රාදේශීය වැඩපල විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමට අදාලව රු.10,889,598 ක තැන්පත් කළ නමුත් නිෂ්කාශණය නොවූ ශේෂයක් හා රු.11,419,020 ක නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ ශේෂයක් තිබූ අතර, එම ශේෂයන් 2021 වර්ෂයේ සිට පැවත එන අතර, එම අගයන් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිංතොට, පෙට්ටිගලවත්ත ප්‍රාදේශීය වැඩපල විසින් පවත්වාගෙන යනු ලබන -013 14515-9-1002දරන ජංගම ගිණුමෙහි ගිණුම් තැබීම පරිගණක මෘදුකාංගය මඟින් සිදු කිරීමේදී අදාල ගණකාධිකාරී විසින් ඉදිරි දාතම යොදා ලෙජර් ගත (Posting) කර ඇති අතර, එම වරද නිවැරදි කිරීම සඳහා අදාල දිනය එළඹෙන තෙක් සිටිය යුතුවේ. | නිශ්කාශනය නොවූ චෙක්පත් ආදායමට ගැනීමටත් තැන්පත් නොකළ ශේෂයන් සම්බන්ධව කඩිනමින් පරීක්ෂා කිරීමටත් කටයුතු කළ යුතු වේ. |
| (ඇ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු රත්මලාන හා ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල් දෙකෙහි ජංගම ගිණුම් තුළ 2022 දෙසැම්බර් 31 දිනට රු. 5,737,177 ක හා රු. 42,547,041 ක හර ශේෂයන් පැවතියද, එම ගිණුම්වලට අදාළ 2022 වර්ෂය සඳහා වූ කිසිඳු තොරතුරක් විගණනය සඳහා ඉදිරිපත් නොවීය. එසේම 2018 වර්ෂයේ සිට කිසිඳු මෙහෙයුම් කටයුත්තක් සිදු නොවන ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල විසින් ලංකා බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමෙහි රු.මිලියන 42 කට අධික මුදලක් කිසිඳු පොලී ආදායමක් නොලබා ජංගම ගිණුමක් තුළ තබා ගැනීම හේතුවෙන් මණ්ඩලයට ලබා ගත හැකිව තිබූ පොලී ආදායමක් අහිමි වී තිබූ බව නිරීක්ෂණය විය. | අදාළ දෝෂය සිදු වී ඇති බව පිළිගනිමි. | නිසි ලෙස ජංගම ගිණුම්වල මුදල් ශේෂය පවත්වාගෙන යාම තුළින් ආයෝජන මගින් ලබා ගත හැකි ප්‍රතිලාභ අහිමි නොකිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.10 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෙර ගෙවුම් කාඩ්පත් භාවිතය සම්බන්ධයෙන් වූ තාක්ෂණික අන්තවල දෙවන අන්තය එනම් Back End (මුදල් ගණුදෙනු හා ප්‍රවේශ හා සම්බන්ධවීමේ පද්ධතිය) හඳුන්වා දීම සඳහා 2022 වර්ෂය සඳහා රු.මිලියන 250 ක් වෙන් කර තිබූ අතර, මණ්ඩලය විසින් ගමනාගමන මණ්ඩල අවශ්‍යතාවය අනුව තාක්ෂණික පිරිවිතර සකස් කර විධිමත් පරිදි ටෙන්ඩර් කැඳවා ඒ සඳහා සැපයුම්කරුවකු තෝරා ගෙන නොතිබූ අතර, ගමනාගමන කොමිෂන් සභාව මගින් ටෙන්ඩර් කැඳවා තෝරාගත් | ජාතික පෙර ගෙවුම් කාඩ්පත් සමස්ථ ව්‍යාපෘතිය සඳහා 2022 අයවැය සැලැස්ම තුල රු.මි.250 ක් ඇතුළත් කර තිබූ අතර, එය නව ඉලෙක්ට්‍රොනික ටිකට් යන්ත්‍ර 3,500 ක් මිලදී ගැනීම සඳහා එම ව්‍යාපාතිය සඳහා අවශ්‍ය තාක්‍ෂණික කටයුතු සඳහා අවශ්‍ය කරන Server පහසුකම් හා සංනිවේදන | නිවැරදි ශක්‍යතා අධ්‍යනයකින් යුතුව ව්‍යාපෘතිය සැලසුම්කර හා ඒ අනුව අවශ්‍ය සැපයුම්කරුවන් තෝරා ගෙන ව්‍යාපෘති කටයුතු ක්‍රියාවට නැගිය යුතු වේ. |

සැපයුම්කරුවකු සමඟ 2021 ජුනි 29 දින කොන්ත්‍රාත්තුව සඳහා ගිවිසුම් ගත වී තිබුණි. ඒ අනුව මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.3,900,000 ක් විය. නමුත් එම මුදලින් රු.1,500,000 ක් පද්ධතිය මිලදී ගැනීමට සහ වසරක වගකීම් කාලයෙන් පසු එළඹෙන වසරකට රු.800,000 බැගින් වූ සේවා ගිවිසුම් 03 කට යොමු වීමට තීරණය කර තිබුණි. නමුත් ව්‍යාපෘතිය අවසන් කිරීමට පෙරම මෘදුකාංග ව්‍යාපෘති මුදල වන රු.1,500,000 ක් සඳහා ගැණුම් ඇණවුමක් නිකුත් කර එකී මුදල 2022 වර්ෂයේ වෙන් කිරීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. කෙසේ වෙතත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය ඉලෙක්ට්‍රොනික ටිකට් යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන නොමැති වීම, භාවිතා කරන කාඩ්පත් භාවිතයේ පවතින ප්‍රායෝගික ගැටළු හා ව්‍යාපෘතිය තුළ මතු වූ තාක්ෂණික ගැටළු මත මෙම මෘදුකාංගය ශ්‍රී ලංගම වෙත ලබා ගැනීම තාවකාලිකව නවතා තිබූ බව නිරීක්ෂණය විය. පහසුකම් සඳහා වේ. මෙහි සඳහන් පරිදි Backend මෘදුකාංග පද්ධතිය ශ්‍රී ලං.ග.ම. තුළ සිදුකල ප්‍රසම්පාදනයකින් තොරව ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් සිදුකල ප්‍රසම්පාදනයෙන් තෝරා ගත් සැපයුම්කරු හරහා ශ්‍රී ලංගම අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සහිතව ලබා ගෙන ඇත. එම Backend පද්ධතියේ වටිනාකම රු.ලක්ෂ 39 ක් වන අතර එහි මූලික ගෙවීම වශයෙන් රු.මි 1.5 ක් එම ආයතනය වෙත මිල කැඳවීම් යොමු කර ඇත. මෙම ගිවිස ගත් රු.මි.1.5 අදාල ආයතනය වන Silver Leap ආයතනය වෙත ගෙවීම් කර නොමැත.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.484,563,354 ක ලාභයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.3,059,980,180 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,544,543,534 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට බස් ගාස්තු සියයට දෙසියකින් පමණ ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර වැඩිවීම්වල හා අඩුවීම්වල ප්‍රතිශතයන් පහත දැක්වේ.

| ආදායම/වියදම | වර්ෂය ( 2022) (රු.මි.) | වර්ෂය (2021) (රු.මි.) | වැඩිවීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| සෘජු මාර්ග ලේඛන ආදායම | 54,957 | 13,608 | 304 |
| අනෙකුත් මාර්ග ලේඛන ආදායම් | 11,393 | 7,169 | 59 |
| බස් රථ මෙහෙයුම් වියදම | 18,060 | 13,049 | 38 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 37,344 | 8,026 | 365 |
| අනෙකුත් පිරිවැය | 6,790 | 2,775 | 145 |

2.2.1 සමාලෝචිත වර්ෂයේ මාර්ග ලේඛන ආදායම සියයට 304 කින් වැඩි වී ඇති බව නිරීක්ෂණය විය. මෙම ආදායමෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා ඇති සාධකය වූයේ බස් ගාස්තු සියයට දෙසියකින් පමණ ඉහළ යාම බව නිරීක්ෂණය විය. අනෙකුත් ආදායම් සාපේක්ෂව විශාල ලෙස ඉහළ නොගියද සියයට 59 කින්

වර්ධනය වී ඇත. මෙයට ප්‍රධාන හේතුව ප්‍රවාහන ගාස්තු ඉහළ යාම තුළ සහනදායි පදනම් මත ලංගමය මගින් පහසුකම් ලබා ගන්නා පිරිසගේ ප්‍රමාණය වැඩි වීම බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

2.2.2 බස් රථ මෙහෙයුම් වියදම සාපේක්ෂව සියයට 38 කින් ඉහළ ගොස් ඇති අතර, මෙයට ප්‍රධාන හේතුව බස් රථ මෙහෙයුම් කාර්යක්ෂම නොවීම හා පාලනයකින් තොරව අතිකාල ලබා දීම හා දිරි දීමනා ගෙවීම් බව නිරීක්ෂණය විය.

2.2.3 ඉන්ධන හා ලිහිසි තෙල් වියදම සියයට 365 කින් ඉහළ යාමට ප්‍රධාන හේතුව ඉන්ධන හා ලිහිසි තෙල්වල මිල අසාමාන්‍ය ලෙස ඉහළ යාමත් විධිමත් අභ්‍යන්තර පාලනයකින් යුතුව ඉන්ධන බෙදා හැරීම් සිදු නොවීම බව නිරීක්ෂණය විය.

2.2.4 අනෙකුත් ඍජු පිරිවැය සියයට 145 කින් වැඩි වී ඇති අතර, එයට ප්‍රධාන හේතුව ඩොලරයේ අගයට සාපේක්ෂව අමතර කොටස් මිල ඉහළ යාම හා විධිමත් පාලනයකින් තොරව අමතර කොටස් මිලදී ගැනීම බව නිරීක්ෂණය විය.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂයේ මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශවල දත්තවලට අනුරූප ප්‍රධාන අනුපාත පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනුපාතය | 2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය | 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය |
|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය | 0.73% | (14.7%) |
| ශුද්ධ ලාභ අනුපාතය (ප්‍රදාන හා සහානාධාර වලට පෙර) | (0.24%) | (20.56%) |
| ජංගම වත්කම් අනුපාතය | 1.34:1 | 1.06:1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1.03:1 | 0.77:1 |

2.3.1 පෙර වර්ෂයට සාපේක්ෂව ශුද්ධ ලාභ අනුපාතයෙහි වර්ධනයක් පෙන්නුම් කළද, එය ප්‍රමාණවත් නොවීමට හේතුව ගණුදෙණුවල විනිවිදභාවයක් නොමැතිවීම හා කළමනාකරනයේ වගවීම පිළිබඳ ගැටළුව බව නිරීක්ෂණය වේ. තවද ශුද්ධ ලාභ අනුපාතය ධන අගයක් ගැනීම සාවද්‍ය ලෙස ප්‍රාග්ධනිත වැය සඳහා භාණ්ඩාගාරයෙන් ලද මුදල වන රුපියල් මිලියන 606.31 ක වටිනාකම ප්‍රදාන හා සහානාධාර යටතේ ගිණුම් ගත කිරීම බව නිරීක්ෂණය විය.

2.3.2 ජංගම වත්කම් අනුපාතය ප්‍රශස්ථ මට්ටමේ නොමැතිවීම මණ්ඩලයේ කෙටි කාලීන ද්‍රවශීලතාවය සහ නියමිත වේලාවට එහි වගකීම් ඉටුකිරීමට ඇති හැකියාවට බාධකයක් බැවින්, ඒ පිළිබඳ මණ්ඩලය විසින් අවධානය යොමුකර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය විසින් පළාත් මට්ටමින් වායු විමෝචන මධ්‍යස්ථාන 09 ක් ඉදි කිරීම සඳහා අදාළ උපකරණ කට්ටල 2018 අප්‍රේල් 26 දින මෝටර් රථ ප්‍රවාහන | මෙම ව්‍යාපෘතියේ ශක්‍යතා වාර්තා සැකසීමක් අවශ්‍ය නොවීමට හේතුවූයේ 2016.03.09දිනැති අමාත්‍ය | මෙම වායුවිමෝචන මධ්‍යස්ථාන අක්‍රිය තත්වයට පත් කිරීම සඳහා කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවෙහි වායු විමෝචන භාරකාර අරමුදල වෙතින් භාරගෙන තිබූ අතර, ඒ සඳහා එකී අරමුදල වෙතින් රු. මිලියන 22 ක් වැය කර තිබුණි. මෙම වායු විමෝචන මධ්‍යස්ථානවලට අදාළ සිවිල් වැඩ ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 89.84 ක ඇස්තමේන්තු මුදලින් 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 27.96 ක මුදලක් වැය කර තිබුණි. මෙම වායු විමෝචන මධ්‍යස්ථාන 09 හි භූමිය ඇස්පෝල්ට් යොදා කාපට් කිරීම සඳහා 2018 අගෝස්තු 16 දින රු. මිලියන 49.9 කට මග නැඟුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම හා ගමනාගමන මණ්ඩලය ගිවිසුමකට එළඹ තිබූ නමුත් ඒ සඳහා දරණ ලද වියදම් විගණනය සඳහා ඉදිරිපත් නොවීය. දැනට මෙම වායු විමෝචන මධ්‍යස්ථාන ක්‍රියාත්මක නොවන අතර, වායු විමෝචන භාරකාර අරමුදල මගින් ලබා දී තිබූ රු. මිලියන 22 ක උපකරණ දිරාපත් වෙමින් පවතින බව නිරීක්ෂණය විය. තවද මෙම වායු විමෝචන මධ්‍යස්ථාන සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි වෙනත් කාර්යයන් සඳහා භාවිතා කර තිබූ අතර, උපකරණ කට්ටල සමඟ ලබාදුන් පරිගණක වෙනත් කාර්යයන් සඳහා යොදා ගෙන තිබුණි. ඒ අනුව වැය කරන ලද රු. මිලියන 49.96 ක මුදල සහ ඉදිරිපත් නොකරන ලද අනෙකුත් වියදම් නිෂ්කාර්යය වියදමක් වී තිබුණි. | මණ්ඩල තීරණය හේතුවෙනි. මෙම ව්‍යාපෘතිය ඉදිරියට නොයාමට හේතු වූයේ සැපයුම්කරුවන් දෙපාර්ශවයක් විසින් ගෙන තිබූ අධිකරණමය ක්‍රියාමාර්ගය මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාමට සාධකයක් වේ යයි යන වැරදි අවබෝධය මතය. | පුද්ගලයින් සොයා බලා ඔවුන්ගෙන් එම අලාභය අය කර ගැනීමටත්, සම්බන්ධිත පුද්ගලයින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතු වේ. |
| (ආ) | බස් රථ ධාවනයට අවශ්‍ය ටයර් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අම්පාර පිහිටුවා ඇති පෙරසවි ටයර් කර්මාන්ත ශාලාව මගින් වාර්ෂිකව පෙරසවි ටයර් 14,400 ක් රු.7,861ක ටයරයක ඇස්තමේන්තුගත ඒකක පිරිවැයකින් නිෂ්පාදනය කිරීමට සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර හා ශ්‍රී ලංගම රු.මිලියන 113.20 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද රු. මිලියන 107.64 ක් වැය කර ටයර් 8,997 ක් පමණක් නිෂ්පාදනය කර තිබූ අතර ටයරයක් නිෂ්පාදනයට වැය වී තිබූ තත්‍ය පිරිවැය රු.11,964 ක් වූයෙන් නිෂ්පාදිත ටයර් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා රු.36,914,691 ක් වැඩියෙන් වැය කර තිබුණි. | අම්පාර ටයර් කර්මාන්ත ශාලාව මගින් පෙරසවි ටයර් නිෂ්පාදන කටයුතු ආරම්භ කරන කාලය තුළ වෙළෙඳපලේ පැවති අමුද්‍රව්‍ය මිල මත ටයරයක විකුණුම් මිළ රු.7,861 ක් ලෙස තීරණය කර ඇත. රට තුළ පැවති උද්ධමනකාරි තත්වය හේතුවෙන් ඒකක පිරිවැය වැඩි වූ අතර, ඇස්තමේන්තු ගත නිෂ්පාදන ටයර් ප්‍රමාණය පහත වැටීමට එය හේතු විය. එබැවින් නිෂ්පාදන වියදම හා විකුණුම් මිල අතර පරතරයක් දක්නට ලැබුණි. | පෙර සවි ටයර් මණ්ඩලය සතු කර්මාන්තශාලා මගින්ම නිෂ්පාදනය කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු අතර පිටතින් මිලදී ගැනීම සඳහා වැය වන පිරිවැය පාලනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාරිතෝෂික පනත අනුව සේවයෙන් ඉවත් වූ සේවකයින් හට ඔවුනට හිමි පාරිතෝෂික මුදල ගණනය කර ඉවත් වූ දිනයේ සිට මසක් ඉකුත් වීමට පෙර ගෙවීම් කළ යුතු වේ. නමුත් එලෙස මසක් තුළ නිසි පරිදි ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පාරිතෝෂික අධිභාර ලෙස රු.8,081,797 ක් ගෙවා තිබුණි. | ලිපිගොනු අස්ථානගතවීම ආදී කරුණු හා කම්කරු කාර්යාලය වෙත යොමු කරන ලද පැමිණිලි මත වූ ලිඛිත නියෝග අනුව හා ගැලපුම් දීමනා පාරිතෝෂිකයට අදාල කර ගන්නා ලෙස කම්කරු කාර්යාලය මගින් ලබාදී තිබූ ලිඛිත නියෝග මත අධිභාර ගෙවා ඇත. | මෙවැනි අඩුපාඩු සිදු නොවන ලෙස පාරිතෝෂික යාවත්කාලීනව ගෙවීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | කටුබැද්ද අධි සුඛෝපභෝගී සංචාරක ප්‍රවාහන සේවයට අයත් වටිනාකම රු.10,800,000 ක් වූ අධි සුඛෝපභෝගී බස් රථයක් අධිවේගී මාර්ගයේදී අනතුරකට ලක් වී අලුත්වැඩියාවන් සිදුනොකර ධාවන තත්වයෙන් ඉවත් කර තිබුණි. ඒ සඳහා පූර්ණ රක්ෂණාවරණයක් ලබාගෙන තිබුණද රක්ෂණ සංස්ථාවෙන් ලබාදී තිබූ කාලය තුළ බස් රථයෙහි අලුත්වැඩියාවන් සිදුකිරීමට ඩිපෝ අධිකාරි විසින් අපොහොසත්වීම නිසා හානි පූර්ණය කිරීම රක්ෂණ සංස්ථාව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. | අදාල අනතුරු අලාභය රක්‍ෂණ වන්දි මඟින් ප්‍රතිපූර්ණය කරගැනීමට එවකට එහි කළමනාකාරිත්වය ක්‍රියාකර නැත. මෙ පිළිබද සත්‍ය තොරතුරු අනාවරණය කර ගැනිමට නැවත විමර්ශයක් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත. | අදාළ වගකිව යුතු පුද්ගලයින්ගෙන් අය කර ගැනීමට හෝ ඔවුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.මිලියන 10 ඉක්මවූ බැංකු ජංගම ගිණුම් 04 ක් විගණනයට නිරීක්ෂණය වූ අතර, කිසිදු පොලී ආදායමක් නොලබා ජංගම ගිණුම්වල රු.624,588,024 ක වටිනාකමක් පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. | මෙම බැංකු ගිණුම් ප්‍රධාන කාර්යාලය වෙළඳපළ ආයෝජන සමඟ සම්බන්ධ කර ඇති අතර බැංකු ගිණුම් වල දිනය අවසානයේ පවතින ශේෂය රාත්‍රී 12.00 න් පසු ඉහත වෙළඳපල ආයෝජන ගිණුම වෙත මාරු වන අතර පසු දින පෙ.ව.09.00 වන විට නැවත ශ්‍රී ලං.ග.ම. ගිණුම වෙත බැරවේ. ඒ සඳහා වන 15% ක වාර්ෂික පොලියක් ශ්‍රී ලං.ග.ම. වෙත පොලී ආදායමක් ලැබෙන බව සඳහන් කරමි. | ලැබෙන පොලී ආදායම නිසි පරිදි හඳුනාගෙන ගිණුම්වල වෙන්ව අනාවරණය කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) 2018 වර්ෂයේ ධාවනය කරන ලද කිලෝමීටර් මිලියන 446 කට අදාලව ගෙවා ඇති මුළු අතිකාල වියදම රු.මිලියන 283 ක්වූ අතර ඒ අනුව 2018 වර්ෂයේ ධාවන කිලෝමීටරයකට අතිකාල වියදම සත 60 ක් විය. 2018 සිට 2022 වර්ෂය දක්වා වැටුප් අගය 100% කින් වැඩි වීම හේතුවෙන් ඊට සාපේක්ෂව අතිකාල වියදම ධාවන කිලෝමීටරයකට රු.1.20 ක් විය යුතු අතර ඒ අනුව 2022 වර්ෂයේ අතිකාල වියදම රු. මිලියන 566 කට වැඩි නොවිය යුතුවේ. නමුත් 2022 වර්ෂයේ අතිකාල වියදම රු. මිලියන 3,074 ක් වූයෙන් වැඩියෙන් ගෙවා ඇති අතිකාල මුදල රු. මිලියන 2,508 ක් වන බව නිරීක්ෂණය විය. ඒ අනුව අතිකාල ගෙවීම් විනිවිදභාවයෙන් තොර බවත්, අතිකාල පාලනය සම්බන්ධයෙන් කළමනාකරණය තම වගකීම නිසි පරිදි ඉටු කර නොමැති බවත්, ඇඟිලි සලකුණු යන්ත්‍ර අක්‍රිය වීමට ඉඩහැරීම අතිකාල පාලනයට සෘජුව බලපා ඇති බවත් නිරීක්ෂණය විය. | 2018/10/01 ට පෙර ශ්‍රී ලංගම ක්‍රියාත්මක වූ වැටුප් ක්‍රමය අනුව ප්‍රාථමික ගණයේ සේවක මහතුන්ගේ අතිකාල රේටය රු.95 කට ආසන්න වේ. නමුත් 2018/10/01 MSD/02/2016 අනුව වැටුප් පරිවර්ථනයත් සමගම එම ගණයේ සේවකයන්ගේ අතිකාල රේටය රු.175 කි. ඒ අනුව අතිකාල රේටය දෙගුණයකින් වැඩිවීමත් 2022 වර්ෂය වන විට එම ගණයේ සේවක මහතුන් සඳහා 2019/01/01 වැටුප් සංශෝධනයක් සිදු කිරීමට අනුමැතිය ලැබීම නිසා මෙම අතිකාල රේටය රු.200 ඉක්මවා යන ලදී. | අතිකාල පාලනය සඳහා විධිමත් වැඩපිළිවෙලක් අනුගමනය කළ යුතු අතර, පද්ධතියක් ස්ථාපනය හරහා වේලාවන් සටහන් කිරීම හා අතිකාල ගණනය සඳහා කටයුතු කළ යුතු වේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පහසුකම් හා තත්වය උසස් කිරීම තුළින් පිරිවැය පාලනය අරමුණු කර වැඩි ධාරිතාවයෙන් යුත් නවීන යන්ත්‍ර උපකරණ වලින් සමන්විත ටයර් පෙරසවි කිරීමේ කර්මාන්ත ශාලාව නවීකරණය සඳහා 2022 වර්ෂයට රු. මිලියන 50 ක් වෙන් කර තිබූ අතර, ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 69.4 ක් වී තිබුණි. ඒ තුළින් දැනට පවතින නිෂ්පාදනාගාරයේ ධාරිතාවය වන ඒකක 15,000 ක් දක්වා දෙගුණ කිරීමට සැලසුම්කර තිබූ නමුත් එම කාර්යය ඉටු නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලයේ කලාප 06 ක් මගින් පමණක් රු.786,866,930 ක වටිනාකමින් යුත් පෙරසවි ටයර් 53,706 ක් මිලදී ගෙන තිබූ බව නිරීක්ෂණය විය. තවද කර්මාන්ත ශාලාවේ පවතින නිෂ්පාදන ධාරිතාවය උපරිම ලෙස උපයෝගී කරගෙන ටයර් පෙරසවි කිරීම කළ හැකි වුවත් අදාළ ප්‍රාදේශික හා ඩිපෝ වලින් පෙරසවි කිරීම | 2022 වර්ෂයේ මේ සඳහා රු.මි.50 ක් වෙන් කර තිබූ අතර, ජාතික තරඟකාරී මිල ගණන් යටතේ පුවත්පත් දැන්වීමක් පළ කර අදාල මිල කැඳවීම් සිදුකරන ලදී. නමුත් එකී ප්‍රසම්පාදන කටයුත්තේදී මිල ගණන් ඉදිරිපත් කළ ආයතන අතරින් ආයතනයක් තෝරා ගැනීමට පත් කළ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇත්තේ මේ සඳහා නව ප්‍රසම්පාදන කටයුත්තකට යාම සුදුසු බවයි. ඊට හේතු ලෙස ඔවුන් දන්වා ඇත්තේ එම ආයතන මඟින් අදාල යන්ත්‍ර මිලදී ගැනීමට පෙර භෞතික පරීක්ෂාවක් සඳහා ලබාදිය නොහැකි බව සහ ඉදිරිපත් | කර්මාන්ත ශාලාවේ ධාරිතාව වැඩි කර නිෂ්පාදනය වැඩි කිරීම හරහා විශාල පිරිවැයකින් සිදු කරන මිලදී ගැනීම් නවතාලිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | සඳහා අවශ්‍ය ටයර් කර්මාන්ත ශාලාව වෙත එවීමට කටයුතු කර නොතිබුණි. | කර ඇති යන්ත්‍ර ආනයනය කර ලබා දීමට හැකි බවය. | |
| (ආ) | 2022 වර්ෂයේ සේවකයින්ගේ රාජකාරි වක්‍ර අනුව වවුනියා ඩිපෝව මගින් මාර්ග 53 ක ධාවනය කිරීමට සැලසුම් කර තිබූ බස් රථ වලින් දෛනිකව ධාවනය කර තිබූ බස් රථ ප්‍රමාණය 34 කි. මෙහි ප්‍රතිඵලයක් ලෙස මාර්ග 19 ක සේවා අඩාලව තිබුණි. ප්‍රමාණවත් රියදුරු සහ කොන්දොස්තර මහතුන් සිටියදී හා අවශ්‍ය ප්‍රමාණයට බස් රථ තිබියදී දෛනිකව රු.200,000 ක පමණ ආදායමක් උපයන වවුනියා සිට කොළඹ දක්වා ගමන් වාර 08 ක්, පොතුවිල් දක්වා ගමන්වාර 02 ක් සහ වවුනියා සිට මහනුවර දක්වා ගමන්වාර 02 ක් සඳහා බස් රථ යොදවා ධාවනයට එක් නොකිරීම හේතුවෙන් 2022 වර්ෂයේ රු.මිලියන 576 ක පමණ ඇස්තමේන්තුගත ආදායමක් අහිමි වී තිබූ බව නිරීක්ෂණය විය. | බස් රථ 34 ක් ධාවනය කිරීම සඳහා අවශ්‍ය අවම ප්‍රමාණය රියදුරු 48 ක් හා කොන්දොස්තර වරුන් 48 ක් බව වැඩිදුරටත් දන්වා සිටිමි. රියදුරු/ කොන්දොස්තර මහතුන් ප්‍රමාණවත් නොවන නිසා දැනට ධාවනය වන්නේ බස්රථ 34 ක් හෝ 33 ක ප්‍රමාණයකි. ලැබෙන සේවක ප්‍රමාණයෙන් යම් බස්රථ සංඛ්‍යාවක් ධාවනය කිරීමට හැකියාව ඇත. | රියදුරු හා කොන්දොස්තරමහතුන් උපරිම ධාරිතාවයෙන් සේවයෙහි යෙදවිය හැකි වන පරිදි රාජකාරි වක්‍ර පිළියෙල කිරීම හා වැඩි ආදායම් ලැබෙන මාර්ග සඳහා ප්‍රමුඛතාවය ලබා දී ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සී/ස අර්ථසාධක වත්කම් ලංකා සමාගම (Provident Property Lanka LTD) වෙත පවරා තිබූ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් රු.10,250,500,000 ක් වූ ඉඩම් වටිනාකම සේවක අර්ථසාධක අරමුදලෙහි ආයෝජනය කර ශ්‍රී ලංගම වෙත මුදල් ලබා දීමට 2016 ජුනි මස 07 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව තීරණය කර තිබූ නමුත් එම සමාගම විසින් ඒ සඳහා මුදල් ගෙවා නොතිබුණි. ශ්‍රී ලංගම විසින් සමාගම වෙත පවරා දී තිබූ එම ඉඩම් ශ්‍රී ලංගම වෙත ආපසු පවරා ගැනීමට 2022 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. මෙම ඉඩම් කට්ටි අතර, මණ්ඩලයේ ගමනාගමන මෙහෙයුම් සඳහා අත්‍යාවශ්‍ය කැස්බෑව, හෝමාගම, මහරගම, මොරටුව හා කටුබැද්ද ඩිපෝවලට අයත් වූ හෙක්ටයාර් 12.1566 ක් හා පිලියන්දල බස් නැවතුම්පලට අයත් හෙක්ටයාර් 0.3306 ක ඉඩමක්ද තිබූ බව නිරීක්ෂණය විය. දැනටමත් මෙම සමාගම අක්‍රිය සමාගමක් බවට සමාගම් රෙජිස්ටාර් | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2015 වර්ෂයට පෙර සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු මුදල පියවීමට විසඳුමක් ලෙස ශ්‍රී ලං.ග.ම. සතුව පැවති නමුත් එම ඉඩම් එවකට පරිහරණය කරන ලද ආයතන වෙතම පවරා ලැබෙන මුදලින් හිඟ අර්ථසාධක අරමුදල් පියවා දැමීමට කටයුතු කරන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදෙන ලදී . ඒ අනුව ශ්‍රී ලං.ග.ම. භාරයේ පැවතුන ඉඩම් කට්ටි 13 ක නොදියුණු තක්සේරු වටිනාකම මත එම ඉඩම් තක්සේරු කර නිදහස් දීමනා පත්‍ර මගින් ප්‍රොවිඩන් ප්‍රොපටි ලංකා සමාගම වෙත පවරා ඊට අදාල මුදල ලබා දෙන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් | මණ්ඩලය සතු ඉඩම් වෙනත් පාර්ශවයන් වෙත පැවරීමේදී එම ඉඩම් පිළිබඳ නිවැරදි පත්තිරු පත් හා වටිනාකම ලබා ගෙන ඒවා නිසි පරිදි ගිණුම් ගතකර පැවරීම් හෝ අලෙවි කිරීම් සිදු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| මගින් ලබාගත් තොරතුරු අනුව තහවුරු විය. එසේ තිබියදී 2023 ජනවාරි 23 අමාත්‍ය මණ්ඩලය විසින් ගත් තීරණයකට අනුව එම සමාගම වෙත පවරා තිබූ ඉඩම් ඉල්ලුම්කාර පාර්ශව වෙත පවරා දී එම ඉඩම් වල වටිනාකම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත ගෙවීමට තීරණය කිරීම හේතුවෙන් එම ඉඩම් කට්ටි නැවත ශ්‍රී ලංගම වෙත පවරා ගැනීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් නිර්මාණය වී ඇති බව නිරීක්ෂණය විය. | අනුමැතිය ලබා දෙන ලදී. කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට පවරා ගත් වේරහැර ඉඩම සඳහා ලැබූ රු.මි. 5,054ක මුදලින් ශ්‍රී ලං.ග.ම. සේවක අර්ථසාධක අරමුදල් ගෙවා අවසන් කර ඇත. | |
| (ආ) බස් රථ වලට අවශ්‍ය ඉන්ධන නිකුත් කිරීමේදී රියදුරු විසින් ඉදිරිපත් කරන ලොග් සටහන් පත්වල අදාළ ගමනාන්තය සහිතව ඒ සඳහා අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය සටහන් කළ යුතු අතර, ඉන්ධන නිකුත් කරන නිලධාරියා විසින් අදාල ලොග් සටහන් පත්‍රිකාවේ සඳහන් ප්‍රමාණයට අනුව ඉර - 08 පත්‍රිකාවේ බස් රථයට යොදන ඉන්ධන ප්‍රමාණය හා බස් රථ අංකය සටහන් කළ යුතුය. නමුත් මහරගම හා ගම්පහ ඩිපෝවල 2022 අගෝස්තු මාසය තුල ලොග් සටහන්වල සටහන් නොකරන ලද රු.11,752,880 ක වටිනාකමින් යුත් ඉන්ධන ලීටර් 27,318 ක් ඉර - 08 පත්‍රිකාවේ සටහන් කර බස් රථවලට නිකුත් කලා සේ ගිණුම්ගත කර තිබුණි. | මහරගම ඩිපෝවේ ඩීසල් ලීටර් 9,916 ක් හා ගම්පහ ඩිපෝවේ ඩීසල් ලීටර් 17,402 ක් ඉර 8 වාර්ථාව අනුව බස් රථ වල අංක සඳහන් නොවී තිබීමත් නිකුත් කළ ඉන්ධන ප්‍රමාණය ලොග් සටහන් පතෙහි සඳහන් නොවී තිබීමත් මණ්ඩලීය පිළිවෙත් පැහැර හැරීමකි. විගණන නිරීක්ෂණය පිළිබදව විශේෂ විමර්ෂණයක් සිදු කොට තෙමසක් ඇතුළත වාර්ථාවක් ලබා දීමට කටයුතු කරමි. කෙසේ වෙතත් විශේෂ විමර්ෂණයේදී යම් අක්‍රමිකතාවයක් සිදුවී ඇති බව අනාවරණය වුවහොත් වගකිව යුත්තන්ට එරෙහිව විනය ක්‍රියමාර්ග ගන්නා බව ද දන්වා සිටිමි. | ඉන්ධන නිකුත් කිරීම සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලනයක් පවත්වා ගත යුතු අතර, ඒ සම්බන්ධයෙන් ඍජු අධීක්ෂණයක් සිදු කළ යුතු වේ. |
| (ඇ) මහරගම ඩිපෝවේ 2022 වර්ෂයේ අගෝස්තු මාසයේ අවසන් දිනට පැවතිය යුතු ඉන්ධන තොග ප්‍රමාණය ලීටර් 326,772 ක් විය. නමුත් එදිනට ටැංකිවල තිබූ සත්‍ය ඉන්ධන තොගය ලීටර් 48,598 ක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව රු.119,614,820 ක් වටිනා ඉන්ධන ලීටර් 278,174 ක ඌණතාවයක් නිරීක්ෂණය වූ අතර, එම ඌණතාවය සඳහා හේතු විගණනයට ඉදිරිපත් නොවීය. මෙලෙස පවත්නා ඉන්ධන තොග ඌණතාවය වෙනුවෙන් මණ්ඩලය විසින්ද සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල රු.36,799,884 ක වෙන් කිරීමක් කර තිබුණි. එසේම මහරගම ඩිපෝවේ 2023 පෙබරවාරි 28 දිනට දෛනික එකතු මුදල් | විගණන නිරීක්ෂණය හා එකඟ වන අතර මෙහිදී මණ්ඩලීය පිළිවෙත් අනුගමනය නොකර තිබීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කඩිනමින් කටයුතු කරනු ලැබේ. | ඌණතාවය අය කර ගෙන වගකිව යුත්තන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| සේප්පුවේ තැන්පත් කර තිබූ අතර, 2023 මාර්තු 01 දින සිදු කරන ලද භෞතික මුදල් පරීක්ෂාවේදී සේප්පුවේ රඳවා තිබූ මුදලින් රු.63,510 ක ඌණතාවයක් අනාවරණය විය. | | |
| (ඈ) සමාලෝචිත වර්ෂයේදී නුවරඑළිය ඩිපෝවේ ආපදා රථයක් සඳහා අසාමාන්‍ය ලෙස රු.1,756,902 ක් වටිනා ඉන්ධන ලීටර් 4,841 ක් සපයා තිබුණද අදාල ආපදා රථයේ මයිලෝ මීටරය ක්‍රියා විරහිත වීම නිසා සහ P-II ලේඛණය නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා කළ වැඩ හා ගමන් කළ ස්ථාන පිළිබඳවත්, ඉන්ධන පාරිභෝජනය සම්බන්ධව විස්තර විගණනට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඉහත ඉන්ධන භාවිතය විගණනයේදී පිළිගැනීමට නොහැකි විය. | මෙම ඩිපෝවේ 29 ශ්‍රී 0784 දරන ආපදා රථය සඳහා ඉන්ධන ලීටර් 4,841 ලබාදී තිබුණි.මයිලෝමීටරය අළුත්වැඩියාව සඳහා අවශ්‍ය කරන අමතර කොටස් වෙළඳපොලෙන් මෙතෙක් ලැබී නැත.ලබාදී ඇති තොරතුරු අනුව වාහනයේ භාවිතය හා ඉන්ධන භාවිතය පිළිබඳ පරීක්ෂණයක් සිදු කොට වාර්ථාවක් ඉදිරිපත් කරමි. | ඩිපෝ කළමණාකරුවන් විසින් සිදු කරන කාර්යයන් සඳහා ඉදිරි වැඩ සටහන් ඉදිරිපත් කළ යුතු අතර, කලාප කාර්යාලයේ අධීක්ෂණය යටතේ කළ වැඩ පිළිබඳ වාර්ථා තබා ගත යුතු වේ. |

## 3.6 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මණ්ඩලය විසින් 2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව දෛනිකව බස් රථ 5,794 ක් ධාවනය කරවීමට සැලසුම් කර තිබුණි. එම කාර්යය ඉටු කිරීම සඳහා අවශ්‍ය එන්ජින් කට්ටල 840 ක් වාර්ෂිකව අළුත්වැඩියා කර ධාවනයට යෙදවීමට සැලසුම් කර තිබූ අතර, ඒ සඳහා භාණ්ඩාගාර හා ශ්‍රී ලංගම ප්‍රතිපාදන රු.මිලියන 66,150 ක් වෙන් කර තිබුණි. නමුත් මණ්ඩලය විසින් අළුත්වැඩියා කර තිබූ බස් රථ ප්‍රමාණය 254 ක් වන අතර, ඒ සඳහා වැය කර තිබූ මුදල රුපියල් මිලියන 77.13 ක් විය. ඒ අනුව අපේක්ෂිත නිමැවුම් ඉලක්කය 70% කින් පමණ පහළ යෑම තුළ ඉලක්කගත පරිදි බස් රථ ධාවනයට එකතු කර ගැනීමට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය. | නමුත් 2022 වර්ෂය සඳහා සැළසුම් සකස් කර ඉලක්ක පනවා වැඩ කටයුතු ආරම්භ කර ඇත. ඉන් අනතුරුව රට තුල ඇතිවූ ඉන්ධන හිඟය නිසා ප්‍රවාහන කටයුතු අඩාල වීමත්, අමතර කොටස් වෙළඳපලෙහි හඟිවීමත්,2022 වර්ෂය සඳහා ප්‍රසම්පාදන කටයුතු ඉටුකර නොතිබීමත් යන හේතු නිසා නිෂ්පාදන කටයුතු ඉලක්ක ගත ප්‍රමාණයට ඉටුකිරීමට නොහැකි විය. | පවත්නා පහසුකම් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගෙන වාර්ෂික ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කරමින් බස් රථ අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) පරණ බස් රථ අළුත්වැඩියා කර ධාවනයට එක් කිරීම අරමුණු කර ගෙන කුරුණෑගල, යටිනුවර, ගම්පහ හා මල්ලාකම් ප්‍රාදේශීය වැඩපොලවල් කේන්ද්‍ර කරගෙන පැරණි ගියර් පෙට්ටි 740 ක් අළුත්වැඩියා කර රථ ඇණිය ධාවන තත්වයේ පවත්වා ගැනීම සඳහා, නිෂ්පාදන ඒකකයට පිරිවැය හා පිරිවැයට 50% ක ලාභ ආන්තිකයක් සහිතව රුපියල් මිලියන 140.4 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. නමුත් 2022 වර්ෂය තුළ අළුත්වැඩියා කර ඇති ගියර් පෙට්ටි ප්‍රමාණය 139 ක් වන අතර, ඒ සඳහා වැය කර ඇති මුදල රුපියල් මිලියන 18.12 කි. ඒ අනුව අපේක්ෂිත ඉලක්කයන් සපුරා ඇති ප්‍රමාණය සියයට 19 ක් විය. | රට තුළ ඇතිවූ ඉන්ධන හිඟය නිසා ප්‍රවාහන කටයුතු අඩාල වීමත්,අමතර කොටස් වෙළඳපලෙහි හිඟවීමත් ඉලක්ක ගත ප්‍රමාණයට ඉටුකිරීමට නොහැකි විය. එසේම මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලා සිටි රු.මි.1,500 න් 2022 වර්ෂය සඳහා ලැබී තිබුනේ රු.මි.750 ක් පමණි. එම මුදල ප්‍රමාණවත් නොවිණි. ඒ අනුව ඉලක්ක ගත ගියර් පෙට්ටි ප්‍රමාණ නිෂ්පාදනය කර ගැනීමට නොහැකි විය. | ක්‍රියාකාරි සැලැස්මට අනුව කටයුතු කිරීමේදී භාණ්ඩාගාර ප්‍රාග්ධන වියදම් පුනරුත්ථාපන වැය ශීර්ෂ වලට මාරු නොකිරීමට වග බලා ගත යුතු අතර, ප්‍රාග්ධන ප්‍රතිපාදන අදාල වැය විෂය තුළ වැය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) රථ ඇණිය ධාවන තත්වයේ පවත්වා ගැනීම සඳහා භාණ්ඩාගාර හා ශ්‍රී ලංගම ප්‍රතිපාදන යොදා ගනිමින් ප්‍රාදේශීය වැඩපල හා ඩිපෝ මගින් බස් බොඩි 300 ක් අළුත්වැඩියා කිරීම සඳහා 2022 වර්ෂයට රුපියල් මිලියන 238.5 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ අළුත්වැඩියා කර ධාවනයට එක් කර ඇති බස් රථ ප්‍රමාණය 180 ක් පමණ විය. | රට තුළ ඇතිවූ ඉන්ධන හිඟය නිසා ප්‍රවාහන කටයුතු අඩාල වීමත්,අමතර කොටස් වෙළඳපලෙහි හිඟවීමත් 2022 වර්ෂය සඳහා ප්‍රසම්පාදන කටයුතු ඉටුකර නොතිබීමත් යන හේතු නිසා නිෂ්පාදන කටයුතු ඉලක්ක ගත ප්‍රමාණයට ඉටුකිරීමට නොහැකි විය. එසේම මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලා සිටි රු.මි.1,500 න් 2022 වර්ෂය සඳහා ලැබී තිබුනේ රු.මි.750 ක් පමණි. එම මුදල ප්‍රමාණවත් නොවිණි. ඒ අනුව ඉලක්ක ගත ගියර් පෙට්ටි ප්‍රමාණ නිෂ්පාදනය කර ගැනීමට නොහැකි විය. | ක්‍රියාකාරි සැලැස්මට අනුව ප්‍රතිපාදන උපරිම අයුරින් උපයෝජනය වන පරිදි අළුත්වැඩියා කටයුතු සිදු කර එකී රථ ධාවනයට එක් කළ යුතු වේ. |
| (ඈ) 2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව පැරණි බස් රථ අළුත්වැඩියා කර ධාවනයට එක් කිරීම අරමුණු කර පැරණි ස්ටාටර් මෝටර් 2040 ක්, පැරණි ඕල්ටනේටර් 1200 ක්, පැරණි ඉන්ධන පොම්ප 1080 ක් හා පැරණි ඉන්ධන විදින 3000 ක් අළුත්වැඩියා කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 180 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණද රු.මිලියන 10.36 ක් වැය කර 2022 වර්ෂයේදී ස්ටාටර් මෝටර් 14 ක්, ඉන්ධන පොම්ප 409 ක් හා ඉන්ධන විදින 1760 ක් පමණක් නිෂ්පාදනය කර තිබූ | ශ්‍රී ලං.ග.ම. රථ ඇණියේ ධාවනය වන බස් රථ නඩත්තුව සඳහා අවශ්‍ය වන ස්ටාටර් මෝටර්,ඕල්ටර්නේටර්, ඉන්ධන පොම්ප හා ඉන්ධන විදින අළුත්වැඩියාව ප්‍රාදේශීය වැඩපල මගින් හා ඩිපෝ ගරාජය මගින් ඉටුකර ගැනීමට සැලසුම් කර ඇත. නමුත් නැවත 2022 වර්ෂයේ බාහිර ආයතන මගින් එම | මණ්ඩලය තුළ හා ඩිපෝවල පවත්නා සම්පත් හා ශ්‍රමය උපරිම අයුරින් උපයෝජනය කර බස් රථ ධාවනයට යෙදවිය හැකි වන පරිදි වැඩ සැලසුම් කිරීමටත් ඒ අනුව නිෂ්පාදනය වැඩි කර බාහිරින් මිලදී ගැනීම සඳහා වැය වන පිරිවැය අවම කර ගැනීමට කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | අතර මෙම අමතර කොටස් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමේ හැකියාව මණ්ඩලය සතුව තිබියදී ඒවා අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදු නොකර බාහිරින් මිලදී ගෙන තිබුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ කලාප 04 කින් පමණක් වැය කර තිබූ මුදල රු.1,205,210 ක් විය. | කටයුතු ඉටුකිරීමට ශ්‍රී ලං.ග.ම. සභාපතිතුමා විසින් අනුමැතිය ලබාදී ඇති අතර ඒ අනුව නැවත බාහිර ආයතන මගින් උප කොටස් අළුත්වැඩියා කිරීම නිසා ප්‍රාදේශීය වැඩපල මගින් අළුත්වැඩියාවන් සිදුකර ගැනීම අඩුවී ඇත. | යුතු අතර, වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කිරීමේදී විධිමත් අධ්‍යයනයකින් යුතුව ප්‍රතිපාදන වෙන් කළ යුතු වේ. |
| (ඉ) | 2022 වර්ෂය තුළ ශ්‍රී ලංගම අභ්‍යන්තර සේවක ශ්‍රමයෙන් හෝ බාහිර ආයතන මගින් ප්‍රධාන කාර්යාලය ඇතුළු ඩිපෝ 106 ක විවිධ කාර්යයන් 160 ක් සඳහා රු.මිලියන 142.04 ක් වෙන් කර තිබූ නමුත් එම කාර්යයන් ඉටු කර නොතිබුණි. | 2022 වර්ෂයේදී මෙම කාර්යයන් කර ගෙන යාමට ප්‍රමාණවත් තාක්ෂණික ගණයේ කාර්ය මණ්ඩලයක් නොමැතිවීම මීට හේතුවේ. තවද අමුද්‍රව්‍ය හිඟ වීමත්, මිල ගණන් අසාමාන්‍ය ලෙස ඉහළ යාමත්, මේ සඳහා බලපෑම් ඇති කරන ලද වෙනත් කරුණු වේ. | අභ්‍යන්තර සේවක කළමනාකරණය තුළින් හා උපරිම ධාරිතාවයෙන් යුතුව අළුත්වැඩියා කටයුතු සිදු කළ යුතු වේ. |
| (ඊ) | සෑම ඩිපෝවක් මගින්ම පාරිතෝෂික ගෙවීම් සඳහා දෛනිකව ලැබෙන මාර්ග ලේඛණ ආදායමෙන් රු.20,000 ක් හෝ රු.30,000 ක් වන ලෙස වෙන් කිරීමක් සිදු කරන බව නිරීක්ෂණය විය. ඒ අනුව පරීක්ෂාවට භාජනය කළ කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ එලෙස රැස්කර ගත් රු.50,065,000 ක මුදලක් 2022 දෙසැම්බර් 31 දිනට ඔවුන්ගේ ජංගම ගිණුමේ රඳවා ගෙන තිබුණි. | එක් එක් ඩිපෝවන්හි පාරිතෝෂික අරමුදල සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකර අනුමැතියක්ද ලබාගෙන ඇති අතර එකී අනුමැති ප්‍රකාරව මෙහි දක්වා ඇති මුදල් ප්‍රාදේශීය කාර්යාලයේ ගිණුම වෙත එක් රැස් කරනු ලබයි. ප්‍රාදේශීය කාර්යාලයේ ජංගම ගිණුම වෙත එසේ එක්රැස් වෙන මුදල දෛනිකව ශ්‍රීලං.ග.ම. ප්‍රධාන කර්යාලයේ ඇති වෙළඳපළ ආයෝජන ගිණුම වෙත සම්බන්ධ කර ඇති අතර එසේ එකී ගිණුම වෙත ආයෝජනය කිරීම තුළින් මේ සඳහා ප්‍රතිලාභයක් ලැබෙන බව සඳහන් කරමි. | විධිමත් සුපරීක්ෂණයක් යටතේ අනුමැතියක් සහිතව හා මධ්‍යගත සැලසුමක් යටතේ අරමුදල් පවත්වාගත යුතු වේ. |

## 3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ඉදිකිරීම සඳහා මණ්ඩලය 2018 මාර්තු 20 වන දින පුද්ගලික සමාගමක් සමඟ රු.61,014,316 ක වටිනාකමට ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු 2018 ජුනි 30 දින නිම කළ යුතු වුවද 2023 මාර්තු වන විටද ඉදිකිරීම් කටයුතු අවසන් කර ඉන්ධන පිරවුම්හල භාවිතයට ගෙන නොතිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුට රු.32,118,352 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරු විසින් නියමිත පරිදි වැඩ නිම නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර කළ වැඩ පිළිබඳ තක්සේරු වාර්තාවක් සහ ඉදිරි වැඩ සඳහා ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස මධ්‍යම ඉංජිනේරු පිළිබඳ කාර්යංශයට (CECB) දන්වා ඇතත්, මේ දක්වා මෙම තක්සේරු වාර්තාව හා ඇස්තමේන්තුව ලබා දී නොතිබුණි. තවද සිදුකරන ලද ස්ථානීය පරීක්ෂණයේදී ඉන්ධන පිරවුම්හලේ වහල මුළුමනින්ම දිරාපත් වීම ඇතුළු, කළ වැඩවල ප්‍රමිතිය පිළිබඳ සැලකිල්ලකින් තොරව හා සැලසුම්වලට අනනුකූල ලෙස කළ වැඩ සඳහා ගෙවීම් නිර්දේශ කර ගෙවීම් කිරීම හේතුවෙන් මේ වන විට මණ්ඩලයට රු.8,978,845 ක අලාභයක් දැරීමට සිදුව තිබුණි. එසේම 2022 දෙසැම්බර් 31 දිනට රු.11,565,320 ක් ගෙවා ගෙන්වන ලද ඩීසල් හා පෙට්‍රල් පොම්ප 07 ක් හා ජෙනරේටරයක් අනාරක්ෂිතව ගබඩා කර තිබූ අතර, ජෙනරේටරයේ වගකීම් කාලයද ඉක්මවා ගොස් තිබුණි. | ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හලේ නිසි කලට වැඩ නිම නොකිරීම සම්බන්ධයෙන් ලාෆ් ඉංජිනියරින් පුද්ගලික සමාගම විසින් තබා තිබූ රු.3,051,000 ක වටිනාකමින් යුත් කාර්ය සාධන ඇපකරය 2020.06.11 දින ශ්‍රී ලං.ග.ම. විසින් පවත්වා ගෙන යනු ලබන ලංකා බැංකු ශාඛාවේ 0001168517දරන ගිණුම වෙත බැර කර ගැනීමට කටයුතු කර ඇත.ඉදිකළ ගොඩනැගිල්ලේ වහලය මුළුමනින් නොව තැන් තැන් වලින් දිරාපත්වී ඇති බව පිළිගනිමි. එමෙන්ම ඉන්ධන පිරවුම්හළ සඳහා සුප්‍රීම් ට්‍රේඩිං සමාගම මඟින් ලබාගත් ඉන්ධන පොම්ප 07 හා අනිකුත් උපකරණ වලින් මෙතෙක් නිසි ප්‍රයෝජන ලබා නොමැති බවද පිළිගනිමි. ඉන්ධන අර්බුදය පැවති සමයෙහි ඉන්ධන පිරවුම්හළ ආරම්භ කිරීමට උපදෙස් ලබා දෙන ලද අතර ඒ හේතුවෙන් හඳුනාගත් මූලිකව සිදුකළ යුතුව තිබූ අළුත්වැඩියා කාර්යයන් සිවිල් ඉංජිනේරු වැඩබිම් සේවක මහතුන් මගින් අවශ්‍ය භාණ්ඩ සපයාදී සිදුකරන ලදි. ඒ සඳහා වැයවූ මුදල රු.704,958.74 ක් පමණ වේ. | ඔරුගොඩවත්ත ඉන්ධන පිරවුම්හල ක්‍රියාත්මක කිරීම සඳහා වසර 05 කට අධික කාලයක් ගතව ඇති අතර, ඒ තුළින් මණ්ඩලයට හිමිකර ගැනීමට තිබූ ආදායමක් අහිමිවී ඇති අතර, ඉන්ධන පිරවුම්හල දිරාපත්වී විනාශනයට පත්ව යන බැවින් කඩිනමින් ඒ සඳහා ක්‍රියාත්මක වී ඉන්ධන පිරවුම්හල ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 3.8 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවිස්සාවේල්ල ඩිපෝවෙන් දිගින් දිගටම ඉන්ධන ණයට ලබා දීම නිසා ඩිපෝ 13 කින්, ප්‍රාදේශීය කාර්යාල 05 කින්, ප්‍රධාන | ණය මුදල් ලබා ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය, ප්‍රදේශීය කාර්යාලය හා ඩිපෝ වෙත | දෛනිකව ඉන්ධන නිකුත් කිරීම් වලට අදාළ ගෙවීම් ගෙවා නිදහස් |

| | | |
|---|---|---|
| කාර්යාලයෙන් හා රුහුණු බස් සමාගමේ ප්‍රධාන කාර්යාලයෙන් රු.16,758,304 ක මුදලක් අයවීමට තිබූ බව නිරීක්ෂණය විය. හිඟ මුදල් අයවීමට නියමිතව තිබියදී දිගින් දිගටම ණයට ඉන්ධන නිකුත් කිරීම සිදු කර තිබූ අතර, අදාළ ණය මුදල් අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | ලිපි ඉදිරිපත් කර ඇති මුත් එකී මුදල් මේ දක්වා ඩිපෝ වෙත ප්‍රේෂණය කර නොමැත. | කිරීම සඳහා කටයුතු කළ යුතු අතර, ඩිපෝව මගින් ඉන්ධන නිකුත් කිරීම විධිමත් පාලනයකට නතු කළ යුතු වේ. |

## 3.9 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු රු.2,063,693,707 ක් වටිනා කල්බදු බස් රථ 433 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට දේපල, පිරියත හා උපකරණ තුළ ඇතුළත් ව තිබූ අතර, ඉන් රු.1,952,651,849 ක් පිරිවැය වූ බස් රථ 409 ක් බස් රථය අයත් ප්‍රාදේශිකය හා ඩිපෝවද හඳුනාගෙන නොමැති බවත් රු.96,896,702 ක් පිරිවැය වූ තවත් බස් රථ 21 ක් කුමන ඩිපෝවට අයත් ද යන්න හඳුනාගෙන නොමැති බව නිරීක්ෂණය විය. මෙම බස් රථ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් යටතේ ලියාපදිංචි කර තිබුණද ඒවායේ ලියාපදිංචි අංක ස්ථාවර වත්කම් උප ලේඛනයේ දක්වා නොතිබුණි. | අදාල දෝෂය සිදුවී ඇති බව පිළිගනිමි. | වත්කමක් බැවින් බස් රථවල අර්තලාභියාට ඇති හිමිකම හා පැවැත්ම තහවුරු වන ලෙස වත්කම් ලේඛණ ගතකර නිවරදිව වත්කම් ලේඛණ පවත්වාගත යුතු වේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීත්වය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)දැනට ශ්‍රී ලංගම තුළ වැඩසටහන් විශ්ලේෂක නිලධාරීන් විසින් සංවර්ධනය කරන ලද apps.sltb.lk හා Erp.sltb.lk වෙබ් Server තුළ ස්ථාපිත ERP මෘදුකාංගය, අවසන් ගිණුම් පිළියෙල කිරීම හා මූල්‍යකරණ කටයුතු හා තොග පාලන කටයුතු විධිමත් කිරීම සඳහා භාවිතා කරන Saga Acc Pack Accounting මෘදුකාංගය, ශ්‍රී ලංගම වෙබ් අඩවිය හරහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ මෘදුකාංගය, ඉලෙක්ට්‍රෝනික ටිකට් යන්ත්‍ර 10,750 ක ප්‍රමාණයක් සම්බන්ධව තොරතුරු හුවමාරු කර ගැනීමේ btm.sltb.lk web Application හරහා භාවිතා කෙරෙන ඉලෙක්ට්‍රොනික ටිකට් යන්ත්‍ර මෘදුකාංග | මධ්‍යගත පද්ධතියක් පැවතීම ඉතා අත්‍යවශ්‍ය කටයුත්තක් සේ සැලකෙන අතර ඒ සඳහා බාධාවක් ද නොමැත. තොරතුරු තාක්ෂණය සඳහා එක් මධ්‍යගත තොරතුරු පද්ධතියක් මිලදී ගැනීම සඳහා අවශ්‍ය මූලික කටයුතු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) යටතේ මේ වන විට සිදු කරමින් පවතී. | සියලු තොරතුරු පද්ධති සම්බන්ධවන පරිදි මධ්‍යගත තොරතුරු පද්ධතියක් හරහා මෙහෙයුම් කටයුතු සැලසුම් කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| පද්ධතිය, බස් රථ ආසන වෙන් කිරීමේ ESAT.SLTB.lkවෙබ් අඩවිය යටතේ ක්‍රියාත්මක මෘදුකාංගය, ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් සඳහා නිදහස් ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ මෘදුකාංගය හා පොලිස් වවුචර් ඇතුළත් කිරීම සඳහා නිර්මාණය කර ඇති මෘදුකාංගය වශයෙන් මෘදුකාංග 07 ක් ක්‍රියාත්මක අතර, එම මෘදුකාංග මධ්‍යගත Server එකක් හරහා සම්බන්ධීකරණය නොවන බව නිරීක්ෂණය විය. | | |
| (ආ) මණ්ඩලය විසින් තොරතුරු විශ්ලේෂකවරුන් දෙදෙනෙකුට රු.75,000 ක බැගින් වූ මාසික වැටුප් ගෙවා සකස් කරන ලද මානව සම්පත් කළමනාකරණ පද්ධතිය (නව), අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා ඇතුළත් කිරීමේ තොරතුරු පද්ධතිය, ලේඛන හුවමාරු කර ගැනීමේ තොරතුරු පද්ධතිය හා කොටස් සහතික නිකුත් කිරීම වෙනුවෙන් වූ මෘදුකාංග 04 ක් ස්ථාපනය කර ඇති නමුත් එම නිලධාරීන් මණ්ඩලයෙන් ඉවත්ව යාමත් සමඟ එම තොරතුරු පද්ධති හා මෘදුකාංග ද අක්‍රීය තත්වයට පත්ව ඇති අතර ඒ සඳහා දරණ ලද වියදම් ද නිශ්කාර්යය බව නිරීක්ෂණය විය. | ශ්‍රී ලංගම පරිපාලන තීරණ මත හා මෘදුකාංග සංවර්ධන නිලධාරීන් විසින් පැරණි පද්ධතීන් වර්තමානයට ගැළපෙන ලෙස නව්‍යකරණය නොවීමත් පද්ධතිවල අනාරක්ෂිත බවත්, වාර්තා ලබා ගැනීමේ ගැටලු සහගත බවත් වෘත්තීය නිලධාරීන් මණ්ඩලයේ සේවයට එකතු නොවීමත් මෙම පද්ධති අසාර්ථක වීමට හේතු වී තිබුණි. | අක්‍රීය තත්වයට පත්ව ඇති පද්ධති හා මෘදුකාංග අක්‍රීය වීමට හේතු සොයා සිදු වූ පාඩු පියවා ගැනීමටත් සියළු පද්ධති වෙනුවට නව මධ්‍යගත පද්ධතියක් ස්ථාපනයට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ පුනරුත්ථාපනය සඳහා මහා භාණ්ඩාගාර වැය ශීර්ෂ 436-02-03-01-2201-12 යටතේ 2022 වර්ෂය සඳහා වෙන් කර තිබූ රු.මි.750 ක මුදලින් මණ්ඩලය විසින් බස් රථ පුනරුත්ථාපනය සඳහා වැය කරන ලද රු.606,310,000 ක මුදල ප්‍රාග්ධනගත කර වාර්ෂිකව ක්ෂය කිරීමකින් තොරව මුළු මුදල වාර්ෂික පාඩුව වූ රු.157,553,197 ට දීමනා හා සහානාධාර යටතේ ගැලපීම තුළින් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු.484,219,604 ක ලාභයක් පෙන්වා තිබුණි. | පිළිතුරු ලබාදී නැත | මහා භාණ්ඩාගාරය මගින් වාර්ෂික විසර්ජන පනත හරහා වෙන් කරන ප්‍රාග්ධන වියදම් නිසි පරිදි උපයෝජනය හා කළමනාකරණය කර ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. |

## 4.3 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගමනාගමන මණ්ඩලයට අයත් සියළුම ඩිපෝ පරිශ්‍රයන්හි සහ ප්‍රාදේශීය වැඩපලවල ඇති අංගන වල ඉන්ධන හා ලිහිසි තෙල් අපද්‍රව්‍ය සහ ප්ලාස්ටික් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පිළිගත් අනුමත ක්‍රමවේදයක් භාවිතා කළ යුතු අතර,ඒ සඳහා 2008 ජනවාරි 25 දිනැති අංක - 1533/16 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් හා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත අනුව මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍රයක් ලබා ගත යුතුව ඇත. නමුත් මණ්ඩලයට අයත් ප්‍රාදේශික 06 ක දත්ත අනුව එකී ප්‍රාදේශික වලට අයත් ඩිපෝ සහ වැඩපලවල් 58 කින් ඩිපෝ සහ වැඩපලවල් 29 ක ප්‍රමාණයක් පාරිසරික බලපත්‍රය ලබා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නැත | පාරිසරික පනතේ වධිවිධාන අනුව අපද්‍රව්‍ය බැහැර කරන ස්ථාන සඳහා පාරිසරික බලපත්‍ර ලබා ගත යුතු වේ. |

## 4.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එක්සත් ජාතින්ගේ තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රයට අනුව එම න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවන් හඳුනාගෙන ඒවා සුරක්ෂිත කිරීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබූ අතර,තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම පරීක්ෂා කිරීම සඳහා මණ්ඩලය විසින් භාවිතා කරන කාර්යය සාධන දර්ශක (KPI) මොනවාද යන්න හඳුනාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නැත | එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය අනුව මණ්ඩලය විසින් හඳුනාගත් කාර්යසාධන දර්ශක (KPI)සකස් කර ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතු වේ. |